# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 147 — 1975 ජනවාරි 17 වැනි සිකුරාද — 1975.01.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 41 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| කනකුරු—ඇබෑර්තු ... ... ... | 43 | අය-වැය ලේඛන ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | දේපල විකිණීම ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 46 | මාර්ග කොමිටි දැන්වීම ... ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — | විවිධ දැන්වීම ... ... ... | 48 |


සැලකිය යුතුයි.—ශ්‍රී ලංකා දුම්රිය මණ්ඩල පනත් කෙටුම්පත 1975 ජනවාරි 10 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

## පළාත් පාලන නිවේදන

### දෙහිවල නගරය

සුළු නගර සභා ආඥාපනත

**1975 වර්ෂය සඳහා වූ විශේෂ කසළ ශෝධන බද්ද**

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) වැනි වගන්තිය යටතේ දෙහිවල නගරයේ විශේෂ කොමසාරිස් විසින්, අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි සීමාකිරීම් හා නිදහස් කිරීම්වලට යටත්ව දෙහිවල නගරය තුළ පිහිටා ඇති කුඹුරු හැර සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හතර බැගින් වූ විශේෂ කසළ ශෝධන බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හිදී සමාන කොටස් හතරකින් ගෙවිය හැකි වන සේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන කොමසාරිස් විසින් දෙන ලද අනුමතිය ඇතිව 1975 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. ටී. වී. එස්. ද අල්විස්,
පළාත් පාලන කොමසාරිස්.

1974.12.23 දින,
කොළඹ දීය.

1–411—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත

13 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධිත) පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය) ගම්සභා ආඥාපනතේ 13(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර නුවරඑළිය පාලන දිස්ත්‍රික්කයේ සහකාර පළාත් පාලන කොමසාරිස් නන්දසේන බඹරවානගේ වන මම, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගඟපලාත ගම්සභාවේ අංක 10 දරණ කොට්ඨාශයේ නියෝජිත රත්නායක මුදියන්සේලාගේ කළුගලගෙදර ධර්මදාස මහතා ගම්සභාවට දැන්වීමක් නොකර පිළිවලින් ගම්සභාවේ රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට තමන් තෝරා පත් කර ගැනීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමකට පත්ව නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගඟපලාත ගම්සභාවේ අංක 10 දරණ කොට්ඨාශයේ නියෝජිත රත්නායක මුදියන්සේලාගේ කළුගලගෙදර ධර්මදාස මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළකිරීමේ දින සිට තම සභිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

න. බඹරවානගේ,
සහකාර පළාත් පාලන කොමසාරිස්,
නුවරඑළිය පාලන දිස්ත්‍රික්කය.

1975 ක්වූ ජනවාරි මස 06 දින,
නුවරඑළිය, පළාත් පාලන කාර්යාලයේදීය.

1–53—75.01.17 දින අංක 147 දරන ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.**

**1972 දෙසැම්බර් 15 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

41—B 71547—5891 (75/1)

F 1

## කච්චයි ගම් සභාව

### ගෝ ඝාතක ආඥාපනත

(272 වැනි අධිකාරය වන) ගෝ ඝාතක ආඥාපනතේ 27 වැනි වගන්තිය යටතේ නියමිත බලධරයා විසින් එනම්, කච්චයි ගම් සභාව විසින් සම්පාදිතව එකී වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් ස්ථිර කරන ලද නියෝග.

ඞී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1975. 1. 02
කොළඹ දී ය.

### නියෝග

1. (272 වැනි අධිකාරය වන) ගෝ ඝාතක ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරණ ලද පොදු ගෝ ඝාතක ස්ථානය සභාපතිවරයාගේ විධානයට යටත්ව, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ හෝ ඔහු විසින් ඒ සඳහා බලය පවරණු ලැබූ සම් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකුගේ හෝ භාරයේ තිබිය යුතුයි. එම නිලධාරියා විසින් එකී ගෝ ඝාතක ස්ථානය ඇතුළත් විනය පාලනය සහ සනීපාරක්ෂක තත්ත්වයද සම්බන්ධයෙන් වගකිව යුතුයි.

2. (1) කිසිම තැනැත්තකු විසින් ගෝ ඝාතක ස්ථානයේ දී—

(අ) ඒ කාර්යය සඳහා ගම් සභාව විසින් පත් කර ගන්නා ලද නිලධරයා විසින් ඒ සතා පරීක්ෂා කොට මිනිසුන්ගේ ආහාරය පිණිස මැරීම සුදුසු යයි අනුමත කර තිබේ නම් මිස ; එසේම

(ආ) මරණු ලැබීමට ප්‍රථම, සභාව විසින් සපයා ඇති හරක් මඩුවේ පැය 24 කට නො අඩු කාලසීමාවක් ඒ සතා තබනු ලැබුවහොත් මිස ; එසේම

(ඇ) කිසියම් දිනයක පූ. භා. 6. 00 ටත් පූ. භා. 9. 00 ටත් අතර කාලයේ දී ඒ සතා මරන්නේ නම් මිස ; නො එසේ නම් කිසිම සතකු නො මැරිය යුතුයි.

එසේ වුවද, විශේෂ අවස්ථාවලදී මෙහි නිශ්චිතව සඳහන් වේලාවට වෙනස් වූ යම් වේලාවක යම් සතකු මැරීම සඳහා සභාපති විසින් බලය දිය හැක.

2. (2) කිසිම තැනැත්තකු විසින් ගෝ ඝාතක ස්ථානයේ දී—

(අ) 2(1) වැනි ඡේදය යටතේ ඒ සතා මැරීම සඳහා අනුමත කළ වේලාවේ සිට පැය 72 ක කාලයක් ගත වූ පසු යම් වේලාවක, සහ

(ආ) (1) වැනි ඡේදය යටතේ අනුමත කළාට පසු ඒ සතා ගෝ ඝාතක ස්ථානයට අයත් භූමියෙන් පණ පිටින් ඉවත් කර ඇත්තේ නම්, ඒ සතා නැවතත් පරීක්ෂා කොට මිනිසුන්ගේ ආහාරය පිණිස මැරීම සුදුසු යයි ඒ ඡේදය යටතේ අනුමත කරණ ලද්දේ නම් මිස ; නැත්නම්

කිසිම සතකු නොමැරිය යුතුය.

3. ගැබිණි එළදෙනක ගෝ ඝාතක ස්ථානයේ දී නොමැරිය යුතුයි.

4. ගව කොටුවට අයත් භූමිභාගයට හෝ ගෝ ඝාතක ස්ථානයට අයත් භූමිභාගයට යම් සතකු ගෙන එන සෑම තැනැත්තකු විසින් ම ඒ සතා ඒ භූමිභාගයේ නවත්වා සිටින කාලය තුළ ඒ සතාට සෑහෙන පරිදි කෑම බීම නිසැකවම ලැබීම සඳහා අවශ්‍ය විය හැකි සෑම විධිවිධානයක් ම සැලැස්විය යුතුයි.

5. ගව කොටුවට හෝ ගෝ ඝාතක ස්ථානයට අයත් භූමිභාගයට යම් සතකු ගෙන එන සෑම තැනැත්තකු විසින් ම, ඒ සතා මරනු ලැබීමට සුදුසු නැතැයි භාරකාර නිලධාරියා විසින් ප්‍රතික්ෂේප කළ වහාම ඒ සතා ගෝ ඝාතක ස්ථානය පිහිටි භූමිභාගයෙන් ඉවත් කළ යුතුයි. නැතහොත් ඉවත් කැරවිය යුතුයි.

6. යම් සතකු 2(අ) නියෝගය යටතේ මැරීමට සුදුසු යයි අනුමත කළාට පසු ඒ සතා ලෙඩ සහිත බව හෝ මිනිසුන්ගේ ආහාර පිණිස මැරීම නුසුදුසු බව හෝ පෙනී ගියොත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් හෝ 2(අ) නියෝගය පරිදි බලය පවරනු ලැබූ නිලධාරියා විසින් ඒ සතා මැරීම තහනම් කළ හැකිය.

7. ගෝ ඝාතක ස්ථානයේ දී මරණ ලද යම් සතකුගේ මස් හෝ මාංසාවශෙෂ 2(අ) නියෝගයෙහි සඳහන් යම් නිලධාරියකුගේ මතය අනුව ලෙඩ සහිතව හෝ මිනිසුන්ගේ ආහාරයට නුසුදුසුව තිබේ නම්, ඒ මස් හෝ මාංසාවශෙෂ වහාම විනාශ කර දැමීමට ඔහු විසින් කට යුතු සැලැස්විය යුතුයි. එසේ නැතහොත් ඒ මස් හෝ මාංසාවශෙෂ විකිණීම පිණිස තැබීම හෝ මිනිසුන් විසින් ආහාරය පිණිස ගැනීම ඉහත් වළකින අන්දමින් ඉවත් කැරවිය යුතුයි.

8. ගෝ ඝාතක ස්ථානය භාර නිලධාරියා විසින් මිනිසුන්ගේ ආහාරය පිණිස මරනු ලැබීමට සුදුසු යයි අනුමත කර නැති හෝ 6 වැනි නියෝගයෙන් විධිවිධාන සළස්වා ඇති පරිදි මැරීම තහනම් කර ඇති කිසිම සතකු මස් පිණිස මැරීමට අවසර නොදිය යුතුයි.

9. කිසිම තැනැත්තකු විසින්—

(අ) මනුෂ්‍ය ආහාරය සඳහා නුසුදුසු යයි 6 වැනි නියෝගය යටතේ ප්‍රකාශිත යම්කිසි මසක් හෝ මාංසාවශෙෂයක් 1 වැනි නියෝගයෙහි සඳහන් යම් නිලධාරියකුගේ විධානය යටතේ හැර ගෝ ඝාතක ස්ථානයෙන් ඉවත් නො කළ යුතුයි.

(ආ) මනුෂ්‍ය ආහාරය පිණිස අදහස් කරණ ලද යම් සතකුගේ කුණපය, ඒ කුණපයේ ඉස්සරහ ගාත්වලත් පස්සා ගාත්වලත් ගෝ ඝාතක ස්ථානය භාර නිලධාරියා විසින් "කච්චෙයි ගම් සභාව" යන මුද්‍රාව පිහිටුවා තිබේ නම් මිස, ගෝ ඝාතක ස්ථානයෙන් ඉවත් නො කළ යුතුයි.

10. වෙනත් යම් සතකු ඉදිරිපිට දී හෝ ඒ ස්ථානයෙහි කලින් මරණ ලද සෑම සතකුගේම මළකුණ ඉවත් කරණු ලැබ හෝ ආවරණය කරණු ලැබ ඒ ස්ථානය පිරිසිදු කරණ තුරු කිසිම සතකු නො මැරිය යුතුයි.

11. යම්කිසි වසංගත රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවෙන රෝගයකින් හෝ චර්මගත රෝගයකින් හෝ පෙළෙන හෝ ළඟදී පෙළෙමින් සිටි හෝ එබඳු රෝගයකින් ළඟදී පෙළෙමින් සිටි තැනැත්තකුට සාත්තු කිරීමෙහි යෙදී හෝ සිටි තැනැත්තකුහට එකී රෝගය බෝවෙන කාලසීමාව හෝ විෂබීජ මේරීමට ගතවන කාලසීමාව ඉකුත් වන තුරු ගෝ ඝාතක ස්ථානයට ඇතුළුවීමට හෝ යම් සතකු මැරීමේ කටයුතුවල යෙදීමට හෝ ඒ ඝාතක ස්ථානය භාරව සිටින තැනැත්තා විසින් අවසර නො දිය යුතුයි.

12. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් හෝ සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා විසින් යථා පරිදි බලය පවරණු ලැබූ යම්කිසි නිලධාරියකු විසින් හෝ සුදුසු සියළුම අවස්ථාවලදී ගෝ ඝාතක ස්ථානය යට ඇතුළු වී එකී ස්ථානය පරීක්ෂා කරණු ලැබීම නීත්‍යානුකූල විය යුතු අතර, එම ස්ථානය භාර තැනැත්තා විසින් ඔහුට අවශ්‍ය විය හැකි සියළුම ආධාර දිය යුතුයි.

13. සභාව විසින් පිහිටුවා ඇති ගෝ ඝාතක ස්ථානය පාවිච්චි කිරීම සඳහා පහත සඳහන් ප්‍රමාණානුකූලව ගාස්තුවක් සභාවට කලින් ගෙවිය යුතු අතර, අයවිය යුතු ගාස්තු ගෙවූ බවට සාක්ෂියක් වශයෙන් ලබාගත් නිල කුවිතාන්සියක් නො මැතිව කිසිම සතකු මරණු නො ලැබිය යුතුයි.

(අ) ඝාතක ගාස්තු—

ගවයන් සඳහා එකකුට රුපියල් එකයි යත පණහයි (රු. 1.50)
එළුවන් සඳහා එකකුට රුපියල් එකයි (රු. 1.00)

(ආ) ගාල් කිරීමේ ගාස්තු—

ගවයන් සඳහා එකකුට රුපියල් එකයි (රු. 1.00)
එළුවන් සඳහා එකකුට ශත පණහයි (.50)

14. ගෝ ඝාතක ස්ථානය භාරකරු විසින් ගෝ ඝාතක ස්ථානයට ගෙන එන ලද සියළුම ගවයින්ගේ ලේඛනයක් පහත සඳහන් ආකෘතිය අනුව තබා ගත යුතුයි :—

| ගව කුවිතාන්සියේ අංකය | වර්ගය | පාට | වයස | හං නිවරණය | | ගෝ ඝාතකයාගේ නම | හරක් ගෙනා වේලාව හා දිනය | පරීක්ෂා කළ දිනය | මරන ලද දිනය | වෙනත් කරුණු | ගවයන් භාර ගත් නිලධාරියාගේ [illegible] අත්සන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | දකුණු පැත්ත | වම් පැත්ත | | | | | | |

15. මෙම නියෝගවල—

"සතා" යන්නෙන් යම් ගවයකු හෝ එළුවෙකු අදහස් වේ.

"ගවයා" යන්නට මී හරක් ද ඇතුළත් වෙති.

"සභාපති" යන්නෙන් සභාවේ සභාපති අදහස් වේ.

"සභාව" යන්නෙන් කච්චයි ගම් සභාව අදහස් වේ.

"සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා" යන්නෙන් චාවකච්චේරියේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා අදහස් වේ.

"මහජන සෞඛ්‍ය පරීක්ෂක" යන්නෙන් කොඩිකාමම් හි මහජන සෞඛ්‍ය පරීක්ෂක හෝ ඔහු වෙනුවට වැඩ බලන යම් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකු අදහස් වේ.

"භාරකාර නිලධාරියා" යන්නෙන් කොඩිකාමම් හි සෞඛ්‍ය පරීක්ෂක හෝ ඔහු වෙනුවට වැඩ බලන යම් මහජන සෞඛ්‍ය පරීක්ෂවරයකු හෝ සභාපති විසින් බලය පවරණු ලැබූ, සභාවේ යම් නිලධාරියකු හෝ අදහස් වේ.

1-632—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

(iv) කිසිම අපේක්ෂකයෙකු ගැන නිර්දේශයක් කිරීමට යම් පැනැත්තකුට වුවමනා නම්, ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයක් ලබාගැනීමකට හෝ බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

(v) යම් අයදුම්කරුවෙකුගේ අයදුම්පතෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන්කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත්කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුනි නම්, රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපැලේදී ප්‍රමාද වූ බවට හෝ නැතිවූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තමුන්ම ඒ අවදානමට මුහුණ පාති.

**අනාගාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම් පත් ආකෘතිය**

**පළාත් පාලන සේවය**

සැ.යු.—(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙලකොට තනතුරු අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු, කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවන් වග බලාගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවන් ස්වකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාලවන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

**.......................තනතුර සඳහා වූ අයදුම් පත**

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————

(ආ) ඉල්ලුම්කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.
ජාතිය :————

(ඔබ ලියාපදිංචි වීමෙන් ලාංකිකයෙකු වී නම්, පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ දිනයත්, හැඳුනුම් අංකයත් සඳහන් කරන්න.)

3. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට නියම වයස :—

අවුරුදු :————. මාස :————. දින :————.

(ආ) උපන් දිනය :—

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුය. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) පිරවිය යුතුය.)

6 විවාහක ද ? අවිවාහක ද ? වැන්දඹු ද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| | පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| | විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

8. අධ්‍යාපනික සුදුසුකම් :—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය/අ.පො.ස. (සාමාන්‍ය පෙළ)—

| | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|---|
| පළමුවෙනි වාරය | | | | |
| දෙවැනි වාරය | | | | |

(ආ) අ. පො. ස. (උසස් පෙළ)—

| සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

(ඇ) වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම් :—

| විභාගයේ නම | සමත්වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

(ඈ) සමර්ථ වී ඇති උසස්ම විභාගය :—

(i) සිංහල :————

(ii) දෙමළ :————.

(iii) ඉංග්‍රීසි :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :————.

10. වෘත්තීය/කාර්මික/පළපුරුද්ද :—

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/ ඇරු තනතුර | සිට | දක්වා |
| --- | --- | --- | --- |
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දින යන් හා අස්වූ දිනයන් දක්වමින් ඇරු තනතුරු සඳහන් කරන්න :————.

(ආ) මීට පළමු, ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාලසීමාවන් :————.

(ඈ) දැනට කරනා රක්ෂාව — පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

(ඉ) සේවාමුක්ත හටයෙක් නම් — සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————:

12. කියවීම, ලිවීම, කථාකිරීම භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස්ද එසේ නැත්නම්, ඔබේ ණය බැදීම්වල ප්‍රමාණය කෙතෙක්ද :————.

16. වෙනත් විස්තර (විශෙෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව. පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුර දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,
තැ. පෙ. 500, කොළඹ 1.

---

## මහර ගම්සභාව

### කම්බිකරු සහායක තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා ම විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—රු. 2,154—8×54—රු. 2,586 වැටුප් ක්‍රමයක රු. 2,316 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමකි. තනතුර ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට යටත් වෙයි.

3. අවශ්‍ය සුදුසුකම්—

(1) ඉල්ලුම්කරු ලාංකිකයකු විය යුතුයි.

(2) 1975.01.13 දින වයස අවුරුදු 22ට නොඅඩු හා 30ට නොවැඩි විය යුතුය. එහෙත් දැනට පළාත් පාලන ආයතනවල හා රජයේ ස්ථිර සේවකයන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලනොපැවැත්වේ.

(3) අපේක්ෂකයා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ අධ්‍යයන පොදු සහතික (සාමාන්‍ය) විභාගයෙන්, භාෂාවෙන් හා වෙනත් විෂයයන් 5 කින්ද, දෙවරකට නොවැඩි වාර ගණනකදී සාමාර්ථය ලබා තිබිය යුතුයි.

(4) අපේක්ෂකයා, කොළඹ දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකාරයකු විය යුතුයි.

(5) (අ) ලංකා කාර්මික විද්‍යාලයේ විදුලි කම්බි ඇදීම පිළිබඳ එක් අවුරුදු පාඨමාලාව හෝ විදුලි කම්බි ඇදීම පිළිබඳ කම්කරු දෙපාර්තමේන්තුවේ මගින් මෙහෙයවන පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර ඇති අපේක්ෂකයින්ද,

(අ) පළාත් පාලන ආයතනයක, ආණ්ඩුවේ ආයතනයක හෝ, සංස්ථාවක විදුලි ආලෝක ව්‍යාපාරයන්හි යටත් පිරිසෙයින් අවුරුදු 10ක පළපුරුද්දක් ඇති අපේක්ෂකයින්ද, ඉහත (අ) කොටසේ සඳහන් සහතික ලබාගැනීමෙන් පසු යටත් පිරිසෙයින් අවුරුදු 2ක පළපුරුද්ද ඇති අයකෙරේ වැඩි සැලකිලි දක්වනු ලැබේ.

(6) ඉතා යහපත් චරිතයක් ඇත්තකු විය යුතුයි. (මෑතදී ලබාගත් සහතික දෙකක් ඉදිරිපත් කළ යුතුයි).

(7) දණ්ඩනීති සංග්‍රහය යටතේ වරදකට වරදකරුවූ හෝ ආණ්ඩුවේ හෝ වෙනත් ප්‍රාදේශීය බලමණ්ඩලයක හෝ යම් නීතිගත සංස්ථාවක හෝ දඬුවම් වශයෙන් අස්කළාවූ හෝ අයගෙන් ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(8) අයදුම් පත්.—පත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ (IV) වෙනි කොටසේ යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ අයදුම් පත්‍රයට සාරානුකූලව සකස් කොට 1975.02.13 දිනට පෙර, මහර ගම්සභාවේ සභාපති වෙත ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි.

කේ. ඒ. ඩී. ජේ. සිරිවර්ධන,
මහර ගම්සභාවේ සභාපති.

1974 දෙසැම්බර් මස 10 වෙනි දින,
කඩවත, පහල කරගහමුණ,
මහර ගම්සභා කාර්යාලයේ දී.

1–656—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

## සියඹලාණ්ඩුව ගම්සභාව

### කාර්යාල කාර්ය සහායක තනතුර

සියඹලාණ්ඩුව ගම්සභාවේ කාර්යාල කාර්යක තනතුර සඳහා සියඹලාණ්ඩුව ගම්සභාවේ ප්‍රාදේශයේ පදිංචි අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත් බාරගනු ලැබේ.

2. වැටුප.—තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය : රු. 540—30×8—24×1—රු. 840 (රු. 636 සහ රු. 732 යන වාර්ෂික වැටුප් වලට පළමු කාර්යක්ෂමතා කඩයිම් ඇත.)

3. (අ) අවශ්‍ය සුදුසුකම්.—1975.01.17 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 30 ට නොවැඩි විය යුතුයි.

(ආ) සිංහල ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය/අංක ගණිතය හෝ වාණිජ අංක ගණිතය සහ සිංහල භාෂාව ඇතුළුව විෂයයන් හයකින් සාමාර්ථයක් ලබා තිබිය යුතුයි.

(ඇ) රජයේ හෝ පළාත් පාලන ආයතනයක සේවයෙන් පහ කරන ලද අයෙකු නොවිය යුතුයි.

(ඈ) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවී නොසිටිය යුතුයි.

(ඉ) යහපත් චරිතයෙන් යුක්ත විය යුතුයි.

(ඊ) අවුරුදු තුනක නොඅඩු. කාලයක් සියඹලාණ්ඩුව ගම්සභා ප්‍රාදේශය තුළ පදිංචි කරුවෙකු විය යුතුයි. සිංහල යතුරු ලියන පිළිබඳ හැකියාව සහ රැකීරක්ෂා කායසීලයේ ලියාපදිංචි වී සිටීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ. රජයේ හෝ/පළාත් පාලන සේවයේ/ප්‍රාදේශීය බල මණ්ඩලවල සේවයේ යෙදී සිටින ස්ථිර සේවකයන්ගේ අයදුම් පත්‍ර ඔවුන් අනෙකුත් සුදුසුකම් ලබා ඇත්නම් උපරිම වයස් සීමාව හා අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ නීතිය ලිහිල් කර සලකා බැලිය හැකිය.

4. (අ) කොන්දේසි.—තනතුර ස්ථිරය. පත්වීම් දිනයේ සිට අයදුම්කරු සේවක අර්ථ සාධක අරමුදලේ සාමාජිකයෙකු වන හෙයින් වැටුපෙන් 6%ක මුදලක් දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන අතර ගම්සභාවෙන් 9%යක මුදලක් එකතු කරනු ලැබේ.

(ආ) පත්වීම් දෑ අවුරුදු පරීක්ෂණ කාලයකට යටත් වේ. එම් කාල සීමාව තුළ සේවය සතුටුදායක වුවහොත් පත්වීම ස්ථිර කරනු ලැබේ. අසතුටුදායක වුවහොත් සේවය නතර කිරීමද කරනු ලැබේ.

5. ඉහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ ආරම්භයේ පළකර ඇති පළාත් පාලන සේවයේ පත්කිරීම් වලට අදාල පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ප්‍රකාර තමන් විසින් ම පිළියෙල කරගත් අයදුම් පත් මගින් ඉල්ලුම් කළයුතුය.

6. අයදුම් පත්‍ර 1975 පෙබරවාරි මස 10 වන දින හෝ ඊට ප්‍රථම සභාපති, සියඹලාණ්ඩුව ගම්සභාව, සියඹලාණ්ඩුව යන ලිපිනයට ලේඛණගත තැපෑලෙන් එවිය යුතුය. ඊට පසුව ලැබෙන අයදුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. අයදුම්පත්‍ර සමඟ පහත සඳහන් සහතික පිටපත් (මුල් පිටපත් නොවේ) අමුනා එවිය යුතුයි :—

(1) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකයේ පිටපතක්.
(2) පදිංචිය පිළිබඳ ග්‍රාමසේවක සහතික පිටපත.
(3) උප්පැන්න සහතිකයේ පිටපත.
(4) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික පත් දෙකක පිටපත්.

8. තනතුර සඳහා ඉල්ලුම් කරන කිසියම් අයදුම්කරුවෙක්,, තමා විසින් අයදුම් පත්‍රයේ සඳහන් කරන්නට යෙදී ඇති තොරතුරු කිසිවක් හෝ අසත්‍ය බැව් කිනම් අවස්ථාවකදී හෝ සොයාගනු ලැබුව හොත්/එළිදරව් වුවහොත් ඔහු තනතුරට එවලේ සිටම නුසුදුස්සකු වන අතර ඒ සඳහා දඬුවම් ලැබීමටද යටත්වනු ඇත.

සභාපති,
සියඹලාණ්ඩුව ගම්සභාව.

1975.01.07,
සියඹලාණ්ඩුව ගම්සභා කායාීලයේ දී ය.

1–657—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපණතේ 42 වැනි වගන්තිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට ගම්සභාව විවිසින් සාදන ලදුව, ඒ වගන්තියේ (3) වන උප වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1975. 01. 03 වෙනි දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථාව

කුරුවිට ගම්සභාව විසින් පිළිගෙන 1961 ජනවාරි 20 වැනි දින අංක 12,272 දරන ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ මලපවහන ගාස්තු පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල (1) වැනි අතුරු ව්‍යවස්ථාවේ " රුපියල් එකක් " යන වචන වෙනුවට " රුපියල් දෙකක් " යන වචන ආදේශ කිරීමෙන් එකී අතුරු ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලැබේ.

2. අතුරු ව්‍යවස්ථාවන්හි සඳහන් ගාස්තු ඒවා අදාල මාසයට ඉක්බිතිව එළඹෙන මාසයේ 10 වෙනි දින හෝ ඊට පෙර ගෙවිය යුතුය.

1–541—75.01.17 දින අංක දරණ ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත

### අතුරු ව්‍යවස්ථා

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ මොනරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව එකී වගන්තියේ (3) වන උපවගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1975. 01. 03 වෙනි දින,
කොළඹ.

### අතුරු ව්‍යවස්ථාව

ගම්සභාව විසින් සම්මත කරගන්නා ලද ජල සම්පාදන සේවය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා, ගම් සභාවට අදාල වන පමණට එහි 27(2) වන අතුරු ව්‍යවස්ථාවට ඉක්බිතිව පහත සඳහන් නව ඡේදය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (3) සභාව විසින් පිහිටුවනු ලැබූ ජල සම්පාදන සේවයෙන් යම් ස්ථානයකට පුද්ගලිකව ජල නලයක් සවිකර දෙනු ලැබූ අවස්ථාවක, එකී ස්ථානය අයිතිකරු හෝ එහි පදිංචිකරු වෙත යථා පරිදි දැන්වීමක් භාර කරනු ලැබූ විට, එකී ජල සම්පාදන සේවයෙන් ජලය ලබා ගන්නා සෑම මාසයක් සඳහාම,

(1) ජලය පාවිච්චි කරන්නේ වානිජ්‍ය කටයුත්තක් සඳහා වූ විට පාවිච්චියට ගන්නා සෑම ගැලුම් දහසකටම රුපියල් තුන බැගින් ගාස්තුවක් ද,

(2) පොදු ආයතනයක් විසින් පාවිච්චි කරන ජලය සඳහා සෑම ගැලුම් දහසකටම රුපියල් දෙකයි ශත පණහක් බැගින් වන ගාස්තුවක් ද ඔහු විසින් ගෙවිය යුතුය. "

1–540—75.01.17 දින 147 දරණ ගැසට් පත්‍රය

---

### මොරටුව නගරය

### නගර සභා ආඥා පණත

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥා පනතේ 153 සහ 157 වැනි වගන්ති යටතේ මොරටුව නගරයේ විශේෂ කොමසාරිස් විසින් සම්පාදිත එකී ආඥාපනතේ 154 වැනි වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1975. 01. 01 මස දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

ජලය සම්පාදනය වෙනුවෙන් මොරටුව නගර සභාව මගින් සම්පාදනය කරනු ලැබ, 1959 ජූලි මස 24 දින අංක 11,814 දරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූද, 1968 දෙසැම්බර් මස 27 දින අංක 14,834 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද අතුරු ව්‍යවස්ථාවෙන් අවසන් වරට සංශෝධනය කරනු ලැබූද, අතුරු ව්‍යවස්ථා තවදුරටත් පහත දැක්වෙන අතුරු සංශෝධනය කරනු ලැබේ.

(1) අංක 32 දරණ අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත දැක්වෙන අතුරු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—

32. මීටරයකින් හැර අන් අයුරකින් ගෘහස්ථ කායාීයන් නොවන කායාීයන් උදෙසා ජලය සපයනු ලබන විට, එවැනි සෑම ජල සේවයක් සඳහා ම එක කරාමයක් වෙනුවෙන් රු. 4 බැගින් වූ ගාස්තුවක් මාස්පතා සභාවට ගෙවිය යුතුය.

(2) අංක 32 (අ) වශයෙන් බල පැවැත්විය යුතු පහත දැක්වෙන අළුත් අතුරු ව්‍යවස්ථාව අංක 32 දරණ අතුරු ව්‍යවස්ථාවට ආසන්නව ඊට යටින් ඇතුලත් කිරීමෙන් :—

32අ. මීටරයක් මගින් හැර වෙනත් අයුරකින් ගෘහස්ථ කාර්‍යයන් සඳහා ජලය සපයන විට, එවැනි සෑම ජල සේවාවක් සඳහාම පහත දැක්වෙන ගාස්තු මාස්පතා සෑම මසකටම පෙරාතුව සභාවට ගෙවිය යුතුය :—

(අ) එකම ජල සේවයක හෝ ස්ථානයක ඇති අඟල් ½ ප්‍රමාණයේ කරාම තුනකට වැඩිවූ සෑම කරාමයක් වෙනුවෙන් මසකට හෝ ඉන් කොටසකට රු. 1ක්,

(ආ) එකම ජල සේවයක හෝ ස්ථානයක ඇති අඟල් ¾ ප්‍රමාණයේ හෝ ඊට වැඩි ප්‍රමාණයේ කරාම තුනකට වැඩිවූ සෑම කරාමයක් වෙනුවෙන් මසකට හෝ ඉන් කොටසකට රු. 2ක්.

(3) අංක 35 දරණ අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අළුත් අතුරු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—

35. මීටරයක් මගින් ගෘහස්ථ කාර්‍යයන් හැර වෙනත් කාර්‍යයන් සඳහා සපයනු ලබන ජලය සඳහා පහත සඳහන් පරිදි ගාස්තු ගෙවිය යුතුය.

(1) පහත සඳහන් කාර්‍යයන් සඳහා සම්පූර්ණයෙන් හෝ කොටසක් යොදවනු ලැබූ ස්ථාන වෙනුවෙන්,

(අ) මෙම අතුරු ව්‍යවස්ථාවේ මීට පහතින් දැක්වෙන වාණිජ ව්‍යාපාර හෝ කර්මාන්ත හෝ හැර ජලය පාවිච්චියට ගනු ලබන ඕනෑම වාණිජ ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් පවත්වාගෙන යෑම හෝ කරගෙන යෑම සඳහා සෑම ගැලුම් දාහකටම රු. 5 බැගින්.

(ආ) හෝටලයක්, ආපන ශාලාවක්, පෞද්ගලික බෝඩින් නිවාසයක්, නවාතැන් දෙන නිවසක්, සිනමා ශාලාවක්, තැබෑරුමක්, ඉස්කාගාරයක්, තෙල් පුරවන ස්ථානයක්, ඡායාරූප ශාලාවක්, කිරිපට්ටියක්, පෞද්ගලික බෙහෙත් ශාලාවක්, පෞද්ගලික ගරාජයක් හෝ වෙනත් වෙළඳ ස්ථානයක් සඳහා සෑම ගැලුම් දාහකටම රු. 5 බැගින්.

(ඇ) මහජන ආයතන, රාජ්‍ය සංස්ථා, පාසැල්, බැංකු, සමුපකාර ගබඩා, සමුපකාර සමිති කාර්‍යාල සඳහා සෑම ගැලුම් දාහකටම රු. 5 බැගින්.

(ඈ) ප්‍රසිද්ධ නෑන ස්ථාන සඳහා සෑම ගැලුම් දාහකටම රු. 5 බැගින්

(ඉ) සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන ඕනෑම කර්මාන්තශාලාවක් සඳහා සෑම ගැලුම් දාහකටම රු. 10 බැගින්.

(ඊ) විකිණීම හෝ කුළියට දීම හෝ පිණිස අශ්වයන්, ගවයන් හෝ වාහන තබා ගැනීම සඳහා සෑම ගැලුම් දාහකටම රු. 5 බැගින්.

(2) පහත සඳහන් කාර්‍යයන් උදෙසා ජලය පාවිච්චි කිරීම සඳහා—

(අ) පිහිනුම් තටාක සඳහා සෑම ගැලුම් දාහකටම රු. 10 බැගින්,

(ආ) කිසිදු වෙළඳ ව්‍යාපාරයක් සම්බන්ධව පාවිච්චි නොකරනු නොලබන්නාවූ ජල උල්පත් සහ හයිඩ්‍රොලික් මීටර් සඳහා සෑම ගැලුම් දාහකටම රු. 5 බැගින්,

(ඇ) ගොඩනැගිලි ඉදි කිරීම සහ පාරවල් තැනීම සහ පාරවල් අළුත්වැඩියා කිරීම සඳහා සෑම ගැලුම් දාහකටම රු. 10 බැගින්.

1-628—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

**ගම්සභා ආඥාපනත**

(257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ බෙම්මුල්ල ගම් සභා ප්‍රදේශයේ ගම් සභාව විසින් පනවනු ලැබූද ඒ වගන්තියෙන් තමා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබූ අතුරු ව්‍යවස්ථා.

ඩී. රාජේන්ද්‍ර,
අතිරේක ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

1975.01.02 වැනි දින,
කොළඹ දී ය.

අතුරු ව්‍යවස්ථා

1. කොළඹ දිස්ත්‍රික්කයේ බෙම්මුල්ල ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් පිළිගත්තා ලද වෙළඳ පොලවල් හා පොලවල් පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාවල XXVII වැනි කොටසේ 1 වෙනි අතුරු ව්‍යවස්ථාවේ කාර්‍යයන් සඳහා බෙම්මුල්ල වෙළඳපොල සම්බන්ධයෙන් වූ වෙළඳපොල ප්‍රදේශය එකී වෙළඳපොලේ සිට සැතපුම් භාගයක අර්ධ විෂ්කම්භයක කවයක් ඇතුලත ප්‍රදේශය විය යුතුය.

2. "බෙම්මුල්ල" වෙළඳපොල යම්කිසි බිම් ප්‍රමාණයක් හෝ වෙළඳ පිළක් පාවිච්චි කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම වෙනුවෙන් පහත සඳහන් ප්‍රමාණයන් අනුව ගාස්තුවක් පණවා අයකල යුතුය :—

| | දිනකට ගාස්තුව රු. ශ. |
|---|---|
| (1) එක් එක් වෙළඳපිල සඳහා ... | 1 0 |
| (2) හතරැස් අඩි 4කට නොවැඩි එක් එක් බිම් ප්‍රමාණය සඳහා ... ... ... | 0 10 |
| (3) හතරැස් අඩි 4කට එහෙත් හතරැස් අඩි 20කට නොවැඩි එක් එක් බිම් ප්‍රමාණය සඳහා ... | 0 30 |
| (4) හතරැස් අඩි 30 කට වැඩි නොවන්නාවූ විට ... | 0 50 |
| (5) හතරැස් අඩි 50 වැඩිවන්නාවූ විට ... | 0 75 |
| (6) හතරැස් අඩි 100කට වැඩිවන්නාවූ විට ... | 1 0 |

3. වෙළඳපොලේ එළිමහන් ප්‍රදේශයේ කඩබක්කියක් හෝ ඉඩ ප්‍රමාණයක් සඳහා පහත සඳහන් ප්‍රමාණයන් අනුව ගාස්තුවක් පණවා අයකල යුතුය :—

| | |
|---|---|
| (අ) බිම් ප්‍රදේශයේ හතරැස් අඩි 8කට වැඩි නොවන්නාවූ විට එක් දිනකට ... ... | 0 20 |
| (ආ) බිම් ප්‍රදේශයේ හතරැස් අඩි 8කට වැඩි වන්නාවූ එහෙත් හතරැස් අඩි 25කට වැඩි නොවන්නාවූ විට එක් දිනකට ... ... | 0 30 |
| (ඇ) බිම් ප්‍රදේශයේ හතරැස් අඩි 25කට වැඩිවන්නාවූ එහෙත් හතරැස් අඩි 50කට වැඩි වැඩි නොවන්නාවූ විට එක් දිනකට ... ... | 0 40 |
| (ඈ) බිම් ප්‍රදේශයේ හතරැස් අඩි 50කට වැඩි වන්නාවූ එහෙත් හතරැස් අඩි 100ට වැඩි නොවන්නාවූ එක් දිනකට ... ... ...... | 0 50 |

1-630—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

**තංගල්ල නගරය**

**නගර සභා ආඥාපනත**

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 153 සහ 157 වැනි වගන්ති යටතේ ඒ සඳහා උචිත බලධාරියා වන තංගල්ල නගරයේ විශේෂ කොමසාරිස් විසින් සාදන ලදුව එම ආඥාපනතේ 154 වැනි වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවය.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1975.01.01 වෙනි දින,
කොළඹ දීය.

**ගොඩනැගිලි සැලසුම් පරීක්ෂා කිරීම හා සලකා බැලීමට අදාල අතුරු ව්‍යවස්ථා**

1. අළුතින් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා හෝ පවත්නා ගොඩනැගිලි වෙනස් කිරීම සඳහා හෝ (268 වන අධිකාරය වන) නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ විධිවිධාන යටතේ ඉදිරිපත් කරනු ලබන සැලසුම් පරීක්ෂා කර බැලීම හා සලකා බැලීම සම්බන්ධයෙන් මේ සමඟ ඇති උපලේඛනයේ නියමිත ගාස්තු ප්‍රමාණයන්ට අනුව, නිගමනය කරනු ලබන ගාස්තුවක් ගෙවිය යුතුය.

2. 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ගෙවිය යුතු ගාස්තුව ගෙවන ලෙස නියම කරමින් තංගල්ල නගරයේ විශේෂ කොමසාරිස්වරයා ගෙන් ලිපියක් ලැබුන විට විශේෂ කොමසාරිස්වරයාගේ අනුමැතිය හෝ කැමැත්ත සඳහා අයදුම්පත ඉදිරිපත් කරන්නා විසින් එම ගාස්තුව ගෙවිය යුතුය. එම ගාස්තුව ගෙවන තුරු කිසිම සැලැස්මක් පරීක්ෂා කිරීම හෝ සලකා බැලීම හෝ නොකළ යුතුය.

### උපලේඛනය

1. අළුත් ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධයෙන් හෝ පවතින ගොඩනැගිල්ලක ගෙබිමේ වර්ග ප්‍රමාණය වැඩිවන අයුරු එය වෙනස් කිරීම සම්බන්ධයෙන් හෝ ඉදිරිපත් කෙරෙන සැලසුම් සඳහා—

| | රු. | ශ. |
|---|---|---|
| (අ) ගෙබිමේ සම්පූර්ණ වර්ග ප්‍රමාණය වර්ග අඩි 600 කට වැඩි නොවන කල්හි ... ... | 5 | 0 |
| (ආ) ගෙබිමේ සම්පූර්ණ වර්ග ප්‍රමාණය වර්ග අඩි 600 කට වැඩි නමුත්, වර්ග අඩි 1,000 කට වැඩි නොවන කල්හි ... ... | 10 | 0 |
| (ඉ) ගෙබිමේ සම්පූර්ණ වර්ග ප්‍රමාණය වර්ග අඩි 1000 කට වැඩි වන නමුත්, වර්ග අඩි 3000 කට වැඩි නොවන කල්හි ... ... | 25 | 0 |
| (ඊ) මීට අමතර වශයෙන් වර්ග අඩි 1000 ක ඒකකයට හෝ ඉන් කොටසකට ... ... | 25 | 0 |
| 2. ගෙබිමේ වර්ග ප්‍රමාණය වර්ග අඩි 600 ට වැඩි පවත්නා ගොඩනැගිලිවල ගෙබිමේ වර්ග ප්‍රමාණය වැඩි නොවන වෙනස් කිරීම් සම්බන්ධයෙන් වන සැලසුම් සඳහා ... ... ... | 10 | 0 |
| 3. සැලසුම් අළුතින් ඉදිරිපත් නොකර අනුමැතිය අළුත් කර ගැනීම සඳහා ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍ර සඳහා ... ... | 10 | 0 |

මෙම උපලේඛනයෙහි "ගෙබිම" යන්නෙන් බිම් මාලයෙහි හෝ වෙනත් මාලයක බිම ඉඩකඩ අදහස් වේ.

1-631—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### නාවලපිටිය නගරය

නගර සභා ආඥාපනත

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 153 වැනි හා 157 වැනි වගන්ති යටතේ නාවලපිටිය නගරයේ විශේෂ කොමසාරිස් විසින් සම්පාදිත වූ ද, එම ආඥාපනතේ 154 වැනි වගන්තියට අනුකූලව රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1975. 01. 01 වැනි දින,
කොළඹදීය.

#### අතුරු ව්‍යවස්ථා

1. මෙම අතුරු ව්‍යවස්ථා 1974 (නාවලපිටියේ) සිනමාශාලාවල දුම්පානය තහනම් කිරීමේ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හැඳින්විය හැකිය.

2. යම් සිනමා ශාලාවක ප්‍රේක්ෂකාගාරය තුළදී නිශ්චිත කාලසීමාවක් ඇතුළත කිසිම තැනැත්තෙකු විසින් දුම්පානය නොකළ යුතුය.

3. 2 වැනි අතුරු ව්‍යවස්ථාවට පටහැනිව ක්‍රියාකරන යම් තැනැත්තෙකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ කල්හි ඔහු රුපියල් පනහක දඩයකට යටත් විය යුතුය.

4. සෑම සිනමාශාලාවකම බලපත්‍රලාභියා විසින්—

(අ) ප්‍රේක්ෂකාගාරය ඇතුළත ප්‍රකට ස්ථානවල සිංහලෙන්, දෙමළෙන් හා ඉංග්‍රීසියෙන් යටත් පිරිසෙයින් අඟල් තුනක්වත් උස පැහැදිලි අකුරෙන් "දුම්බීම තහනම්" යන වචන ඇතුළත් දැන්වීම් ප්‍රදර්ශනය කළයුතුය; තවද

(ආ) නිශ්චිත සිනමාශාලාවේ බාහිර කොටසේ ප්‍රකට ස්ථානයක ප්‍රේක්ෂකාගාරය ඇතුළත "දුම්බීම තහනම්" යන වචන ඇතුළත් දැන්වීම් ප්‍රදර්ශනය කළ යුතුය.

5. නිශ්චිත කාලසීමාව තුළදී ප්‍රේක්ෂකාගාරය ඇතුළත කිනම් හෝ යම් ආකාරයක දුම්කොළ විකිණීම හෝ විකිණීමට ඉඩදීම ඔහු විසින් නොකළ යුතු බව සෑම සිනමා ශාලාවකම බලපත්‍ර දරන්නකු වෙත නිකුත් කරනු ලබන බලපත්‍රයක අඩංගු කොන්දේසියක් විය යුතුය.

6. මෙම අතුරු ව්‍යවස්ථාවල—

"සිනමාශාලාව" යන්නෙන් සිනමා යන්ත්‍රයක්, මැජික් ලන්තෑරුමක් හෝ එවැනි වෙනත් උපකරණයක් මාර්ගයෙන් පින්තූර මහජනයාට ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රසිද්ධ රඟදැක්වීම් අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍ර ලද ගොඩනැගිල්ලක් අදහස් වේ.

"නිශ්චිත කාලසීමාව" යන්නෙන් යම් මහජන ප්‍රදර්ශනයක් ආරම්භ කිරීමට විනාඩි 30 කට කලින් පටන්ගෙන එම මහජන ප්‍රදර්ශනය නිම වෙනවාත් සමගම අවසන්වන එම මහජන ප්‍රදර්ශනය පවත්නා මුළු කාලයද ඇතුළත් වන කාලසීමාව අදහස් වේ.

"දුම්බීම" යන්නෙන් සුරුට්ටු, සිගරැට්, බීඩි හෝ වෙනත් යම් ආකාරයකින් හෝ දුම්කෝවක (පයිප්පයක) ගඩුගුඩාවක ආධාරයෙන් හෝ වෙනත් ආකාරයකින් දුම්කොළ පාවිච්චි කිරීම අදහස් වේ. තවද,

"ප්‍රසිද්ධ රඟ දැක්වීම" යන්නට (176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟදැක්වීම් ආඥාපනතෙහි ඒ සඳහා දී ඇති අර්ථයම යෙදේ.

1-629—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

## විවිධ දැන්වීම්

### අම්බලන්ගොඩ විශේෂ කොමසාරිස් කාර්යාලය

1975 වර්ෂයේ වරිපනම් බදු ලේඛන

1975 වර්ෂය සඳහා, අම්බලන්ගොඩ නගරයේ විශේෂ කොමසාරිස් කාර්යාලයේ වරිපනම් බදු ලේඛන දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛන නියමිත කාර්යාල වේලාවන් තුළදී මෙම කාර්යාලයේදී පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බවත්, 255 වැනි අධිකාරිය වූ පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ 166 වැනි වගන්තියේ කියැවෙන පරිදි 252 අධිකාරිය වූ, මහ නගර සභා ආඥාපනතේ අංක 235 (1) සහ (2) දරණ වගන්ති අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්ලිව්. එච්. ඩබ්ලිව්. සොයිසා,
විශේෂ කොමසාරිස්—අම්බලන්ගොඩ නගරය.

1975. 01. 01 වන දින,
අම්බලන්ගොඩ විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

1-489—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### විශේෂ කොමසාරිස් කාර්යාලය—අම්බලන්ගොඩ නගරය

1975 වර්ෂයේ දේපල බද්ද

නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 160(1) වගන්තියේ ප්‍රකාර, 1974 වර්ෂයේ බලපැවැත්වෙමින් තිබෙන පරිදිම, 1975 වර්ෂය සඳහාද, නගර සභා සීමාව තුල තිබෙන සියලුම නිශ්චල දේපල වල වාර්ෂික තක්සේරුවෙන් සියයට එකොළහක ඒකාබද්ධ බද්දක් ම විසින් පනවා තිබෙන බවද, එම බද්ද පිළිවෙළින් මාර්තු 31 වනදාසින්, ජූනි 30 වනදාසින්, සැප්තැම්බර් 30 දාසින් හා දෙසැම්බර් 31 දාසින් අවසන් වන අයුරු ත්‍රයිමාසික වශයෙන් ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්ලිව්. එච්. ඩබ්ලිව්. සොයිසා,
විශේෂ. කොමසාරිස්—අම්බලන්ගොඩ නගරය.

1975. 01. 01 වන දින,
අම්බලන්ගොඩ විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

1-488—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

### කොළඹ දිස්ත්‍රික්කයේ දඬුගම්පේරුව ගම ප්‍රදේශය

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි දැක්වෙන අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1975 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව දඬුගම්පේරුව ගම්ප්‍රදේශ සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුට ඒ සඳහා තමා විරුද්ධ වන්නේ අසවල් කාරණා නිසායැයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරය) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| | අයදුම්කරුගේ නම හා ලිපිනය | මස් කඩ පිහිටි ස්ථානය | වෙළඳාමේ ස්වභාවය |
|---|---|---|---|
| 1. | අන්තෝනිගේ මිලී ඇස්තර් ප්‍රනාන්දු මහත්මිය, අංක 102, දඬුගම, ජාඇල | දඬුගම අංක 1 වරිපනම් අංක 197—මීගමුව පාර ... | එළ හරක් මස් |
| 2. | කෝරළගමගේ විල්බට් ප්‍රනාන්දු මහතා, අංක 540, දඬුගම, ජාඇල | දඬුගම අංක 2, වරිපනම් අංක 247, මීගමුව පාර ... | එම |
| 3. | කුරුගමගේ ජයන්තා ප්‍රේමරත්න පෙරේරා මහතා, අංක 183, දඬුගම, ජාඇල | දඬුගම අංක 3 වරිපනම් අංක 354, මීගමුව පාර ... | එම |
| 4. | කෝරළගමගේ ෂෙල්ටන් ප්‍රනාන්දු මහතා, අංක 544, දඬුගම, ජාඇල | කුඩහකපොල අංක 1, බෙලිගහවත්ත ... | එම |
| 5. | මිහිඳුකුලසූරිය ඇන්තනි ජෝෂප් තිසේරා මහතා, මඩම පාර, තුඩැල්ල, ජාඇල | තුඩැල්ල අංක 1, වරිපනම් අංක 41, ජාඇල පාර ... | එම |
| 6. | කුරණගේ පීලික්ස් නිමල් පෙරේරා මහතා, තුඩැල්ල, ජාඇල | තුඩැල්ල අංක 2, වරිපනම් අංක 8, මීගමුව පාර ... | එම |
| 7. | කුරණගේ පීලික්ස් නිමල් පෙරේරා මහතා, තුඩැල්ල, ජාඇල | ඒකළ අඩි හැට, ඒකල වත්ත ... | එම |
| 8. | සුල්තානා මොහිදීන් මහතා, අංක 179, ගල්ලොලුව, මිනුවන්ගොඩ | කොටුගොඩ, මන්ඩාලපිටියේ වත්ත ... | එම |
| 9. | කුරණගේ ජෝෂප් පැට්‍රික් පෙරේරා මහතා, දැලතුර, ජාඇල | දැලතුර, මීදිගහවත්ත ... | එම |
| 10. | නාවලගේ ඇල්ප්‍රඩ් කුරේ මහතා, බටගම උතුර, ජාඇල | මාඑළිය, දවටගහ වත්ත ... | එම |
| 11. | ඇම්. ඩී. විලියම් මහතා, යක්කඩුව, ජාඇල ... | ඒකළ, සැන්ඩික්‍රාෆ්ට් වත්ත ... | එම |
| 12. | කුරුගමගේ ප්‍රැන්සිස් පෙරේරා මහතා, අංක 178, දඬුගම, ජාඇල | දඬුගම කොටුපල, වරිපනම් අංක 397, මීගමුව පාර ... | ඌරු මස් |

ඩබ්ලිව්. සිරිසේන,
පරිපාලන නිලධාරී, දඬුගම්පේරුව ගම්ප්‍රදේශය.

දඬුගම්පේරුව ගම්ප්‍රදේශ කාර්යාලය,
දඬුගම, ජාඇල.
1974.12.31

1-490—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### පස් සර නගරය

1975 වර්ෂයේ වරිපනම් පොත

1975 වර්ෂය සඳහා මෙම නගරයේ වරිපනම් පොත දැනට සූදානම්ව ඇති බවත්, එම පොත කාර්යාල වේලාවන් තිදී පරීක්ෂාකර බැලීම සඳහා තබා ඇති බවත් 256 වැනි අධිකාරය වූ සුළු නගර සභා ආඥාපනතේ 165 වැනි වගන්තියෙන් කියවෙන පරිදි 252 වැනි අධිකාරය වූ මහ නගර සභා ආඥාපනතේ 235 (1) දරණ වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

ටී. අයි. කමාල්දීන්,
පස් සර නගරයේ විශේෂ කොමසාරිස්.

1975 ජනවාරි මස 02 වැනි දින,
පස් සර විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

1-493—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### හාලිඇල සුළු නගර සභාව

ගෝඝාතක ආඥාපනත—(272 වැනි අධිකාරය)

මෙහි පහත උප ලේඛනයේ නම් සඳහන් අයවලුන්, 1975 වර්ෂය තුලදී මස් පිණිස සතුන් මැරීමට හා මස් විකිණීමට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, ඒ අනුව, 1975 වර්ෂයට බලපත්‍ර නිකුත් කිරීම ගැන විරුද්ධවන, හාලිඇල සුළු නගර සභා ප්‍රදේශය තුල පදිංචි ඕනෑම අයෙකු වේනම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින දහතරක් (14) ඇතුළත තමා ගේ විරුද්ධත්වයන්ට හේතු සඳහන් කරන ලද ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මා වෙත ඉදිරිපත් කරන ලෙස ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7(2) දරණ වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාමේ ස්වභාවය | වෙළඳාම් කරන ස්ථානය |
|---|---|---|---|
| (1) | ඒ. ආර්. ඇම්. ෂාබදීන්, අංක 182, පුවක්ගොඩ මුල්ල, බදුල්ල ... | එළහරක් මස්—මස් පිණිස සතුන් මැරීම ... | අංක 110 |
| (2) | ඒ. ආර්. ඇම්. ෂාබදීන්, අංක 182, පුවක්ගොඩ මුල්ල, බදුල්ල ... | එළහරක් මස්—මස් පිණිස සතුන් මැරීම ... | අංක 194 |

ටී. අයි. කමාල්දීන්,
පරිපාලන නිලධාරී,
හාලිඇල සුළු නගර සභාව.

1974.12.31 වැනි දින,
හාලිඇල,
සුළු නගර සභාව.

1-430—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

### පස්සර සුළු නගර සභාව

1975 වර්ෂයට වරිපනම් බද්ද

සුළු නගර සභා ආඥාපනතේ (256 වැනි අධිකාරය) යටතේ මෙම ගතවී යන 1974 වර්ෂයට බලපවත්නා පහත සඳහන් වරිපනම් බදු 1975 වර්ෂයටද එලෙසම පැනවීමට පස්සර නගරයේ විශේෂ කොමසාරිස් විසින් තීරණය කරණ ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඉහත සඳහන් ආඥාපනතේ 159 වැනි වගන්තිය ප්‍රකාර මෙම නගර සභාව තුළ පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපොළවල වාර්ෂික වටිනාකමෙන් සියයට හය බැගින් වාර්ෂික බදු පිළිවෙළින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන් හි දී ත්‍රෛමාසික වශයෙන් සම කොටස් හතරකින් මෙම විශේෂ කොමසාරිස් කාර්යාලයට ගෙවිය යුතු වේ.

ඊ. අයි. කමාල්දීන්,  
විශේෂ කොමසාරිස්,  
පස්සර නගරය.

පස්සර නගරයේ,  
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී,  
1975 ජනවාරි මස 02 වැනි දින.

1-494—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### පලුකාමම් ගම් ප්‍රදේශය

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ) අතුරු ව්‍යවස්ථා පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරය) 3 වැනි වගන්තිය යටතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ පලුකාමම් ගම් ප්‍රදේශයේ කටයුතු පාලනය කරන නිලධාරියා විසින් නියම කරන ලද පහත සඳහන් නියෝගය එකී වගන්තිය ප්‍රකාර පළකරනු ලැබේ.

#### පාලන නියෝගය

"රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සම්පාදන කරනු ලැබ, 1972 නොවැම්බර් මස 03 වැනි දින අංක 32 දරණ ගැසට් පත්‍රයේ ප්‍රකාශ කරන ලද්දා වූද, 1973 ජූනි මස 29 වැනි දින අංක 66 දරණ ගැසට් නිවේදනයෙන් ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරන ලද, "පුස්තකාල" සම්බන්ධ වූ, පොදු අතුරු ව්‍යවස්ථාවේ XLII වැනි කොටස, මෙම නියෝගය ගැසට් පත්‍රයේ පළවන දින සිට ක්‍රියා කර ගැනීමට, පළාත් පාලන ආයතන (පොදු අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් නියම කරනු ලැබේ."

සී. වාමදේවන්,  
පලුකාමම් ගම්ප්‍රදේශයේ කටයුතු  
පාලනය කරන නිලධාරී.

පලුකාමම් ගම් ප්‍රදේශයේ කටයුතු පාලනය කරන  
නිලධාරියාගේ කායභාලය,  
තිරුපලුකාමම්, පෙරියපෝරතිවු.  
1974.12.18 වැනි දින දීය.

1-500—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### මාතර විශේෂ කොමසාරිස් කායභාලය

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනත (272 වැනි අධිකාරය)**

මෙහි පහත සඳහන් උපලේඛනයෙහි දක්වෙන අය විසින් මස් විකිණීම සඳහා 1975 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට මාතර පළාත් ආණ්ඩු සභාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුට ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ නිසා යයි දක්වෙන ලියවිල්ලක පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වන දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වැනි අධිකාරයේ අංක 7 දරණ වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

| | අයදුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|---|
| 1. | මොහමඩ් මොහමඩ් අල්වි, 19/10, මොරිස් පාර, ගාල්ල | ගව මස් | කොටුවේගොඩ අංක 1 දරණ ගව මස් කඩය |
| 2. | මොහමඩ් ඉස්මායිල් මොහමඩ් නූර්, 46, පරණ තංගල්ල පාර, මාතර | ගව මස් | කොටුවේගොඩ අංක 2 හා 3 දරණ ගව මස් කඩ |
| 3. | සයින් අබ්දුල් සමීන්, 24/4, හෝල්ස් පාර, ගාල්ල | එළු මස් | කොටුවේගොඩ අංක 4 දරණ එළු මස් කඩය |
| 4. | මොහමඩ් ඊබ්‍රහිම් අබ්දුල් හමීල්, 174/5, හිරිඹුර පාර, ගාල්ල | ගවමස් හා එළු මස් | බතුතා මාර්කට්හි අංක 1 හා 2 දරණ ගව හා එළු මස් කඩය |

ඒ. ඊ. බුල්ජන්ස්,  
විශේෂ කොමසාරිස්,  
මාතර නගරය.

1975 ජනවාරි මස 01 වැනි දින,  
මාතර නගරයේ විශේෂ කොමසාරිස් කායභාලයේ දීය.

1-412—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### ඕතර පළාත දකුණ ගම්සභාව—හලාවත දිස්ත්‍රික්කය

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1975 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන විරුද්ධව ඕතර පළාත දකුණ ගම්සභා සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ ගැන විරුද්ධ වන්නේ අසවල් කරුණ ගැන යයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත දී මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරිය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩබ්ලිව්. ඊ. ප්‍රනාන්දු,  
පරිපාලන නිලධාරී,  
ඕතර පළාත දකුණ ගම්සභාව.

1974 දෙසැම්බර් මස 30 වෙනි දින,  
දන්කොටුව,  
දුම්මලකොටුවේ ඕතර පළාත් දකුණ ගම්සභා කායභාලයේ දීය.

#### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම | වෙළඳාම් කරන ස්ථානය |
|---|---|---|---|
| 1. | ඒ. ඩී. ජෝශප් අප්පුහාමි | හරක් මස්, ඌරු මස් | උතුරු ගෝනාවිල, කැටකැල්ලවත්ත නමැති ඉඩමෙ පිහිටි මස් කඩය |
| 2. | ඒ. ඩී. ඇලෝසියස් අප්පුහාමි | හරක් මස්, එළු මස්, ඌරු මස් | මෝරුක්කුලිය, (ඕතර කඹරවිල) තෝප්පුව-දන්කොටුව පාරේ උණ පඳුර වත්තේ පිහිටි මස් කඩය |

1-470—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

### වරකාගොඩ පළාත ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත සඳහන් උප ලේඛනයේ සඳහන් අය විසින් එම උපලේඛනයේ සඳහන් ස්ථානයේ 1975 වර්ෂය තුළ එළ හරක් මස් ගෙනැවිත් තබා විකිණීම පිණිස බල පත්‍රයක් ඉල්ලුම්කර ඇති බවත්, ඒ අනුව එකී බල පත්‍රය නිකුත් කිරීම ගැන වරකාගොඩ පළාත ගම් සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කොට පිටපත් දෙකකින් යුතු ලියවිල්ලක්, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් (දහතරක්) ඇතුළත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනතේ (272 වැනි අධිකාරය) 7 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| වෙයන්ගල්ලේ පදිංචි ඇම්. ජේ. ජෝපර් ... | එළ හරක් මස් ... | වෙයන්ගල්ලේ පිට වගුර වත්ත නමැති ඉඩම |

හර්මන් කන්නන්ගර,
සභාපති,
වරකාගොඩ පළාත ගම් සභාව

1975.01.02.

1–460—1975.01.17 දින අංක 147 දරන ගැසට් පත්‍රය

---

### කෝට්ටේ–ගල්කිස්ස ගම්ප්‍රදේශය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනත යටතේ දැන්වීම

මෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන අය විසින් මස් විකිණීම සඳහා 1975 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, එම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව කෝට්ටේ–ගල්කිස්ස ගම්ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධවන්නේ අසවල් කරුණ නිසායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනතේ 272 වන අධිකාරයේ අංක 7 දරණ වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. ඒ. එම්. එම්. ජිෆ්රි මහතා, 44/12, මරික්කාර් පාර, කළුතර උතුර | 226, දෙහිවල පාර, බොරලැස්ගමුව ... | හරක් මස් |
| 2. එම්. එන්. එම්. මොහමඩ් නියාස් මහතා, 10, උස්වත්ත, 2 වැනි පටුමග, මොරටුව | 126, හයිලෙවල් පාර, පන්නිපිටිය ... | හරක් මස් |
| 3. එම්. ඒ. ජින්නා මහතා, 17, කැරන් පෙදෙස, දෙහිවල ... | 90, මාදිවල පාර, උඩහමුල්ල ... | හරක් මස් |

1975 ජනවාරි 2 වැනි දින,
කෝට්ටේ–ගල්කිස්ස පාලන නිලධාරි කාර්යාලය,
බොරලැස්ගමුව.

ජේ. ඒ. බී. එල්. රණසිංහ,
පාලන නිලධාරි,
කෝට්ටේ–ගල්කිස්ස ගම් ප්‍රදේශය.

1–416—1975.01.17 දින අංක 147 දරන ගැසට් පත්‍රය

---

### අඹගමුව දකුණ ගම්සභාව

### ගෝඝාතක ආඥා පනත

මෙහි පහත දැක්වෙන නම් සඳහන් අය විසින් ඒ ඒ නම් ඉදිරියෙහි දැක්වෙන ස්ථානයන්හි ගවමස් කඩ පවත්වාගෙන යාමට 1975 වර්ෂයට බලපත්‍ර ඉල්ලා අයදුම් පත්‍ර මා වෙත එවා ඇති බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන අඹගමුව දකුණ ගම්ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙකු විරුද්ධ වනුයේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුක්ත ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පල වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, ගෝ ඝාතක ආඥා පනතේ (272 අධිකාරය) 7 (3) උ වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

1974.12.30 දින,
නෝටන්බ්‍රිජ්හි කිරිවන්එළිය.
අඹගමුව දකුණ ගම්සභා ශාඛා කාර්යාලයේ දීය.

එස්. ඒ. සිල්වා,
අඹගමුව දකුණ ගම්සභාපති.

#### උපලේඛනය

| අයදුම්කරුවන්ගේ නම් සහ ලිපිනයන් | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. ටී. සාල්ඩින්, බදුර්දීන් ස්ටෝර්ස්, හැටන් ... | ගව මස් ... | නෝටන් පාලම, පොදු වෙළඳ පොලේ, අංක 10 දරණ කඩ කාමරය |
| 2. ඒ. ඇස්. ඇම්. අන්වර්, මා. අංක 10, නව නගරය, මස්කෙළිය. | ගව මස් ... | මස්කෙළිය, පොදු වෙළඳ පොලේ අංක 10 දරණ කඩ කාමරය |
| 3. එච්. එම්. ඉසදීන්, අංක 65/1, රජවත්ත ... | ගව මස් ... | රජවත්ත, අංක 65/1, දරණ ස්ථානය |

1–415—1975.01.17 දින අංක 147 දරන ගැසට් පත්‍රය

### මාවනැල්ල නගරය

මෙහි පහත දැක්වෙන උප ලේඛණයෙහි සඳහන් අය විසින් ඒ අයගේ නම ඉදිරියේ සඳහන් ස්ථානයෙහි මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1975 වර්ෂයට ඉල්ලුම් කර තිබෙන බව ගෝඝාතක ආඥාපනතේ (සංශෝධිත ලංකා ව්‍යවස්ථා ප්‍රඥප්තියේ 271 වැනි අධිකාරය) 7(2) වැනි වගන්තිය ප්‍රකාර මාවනැල්ල නගරය පාලනය කරන විශේෂ කොමසාරිස් විසින් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම බලපත්‍රය නිකුත් කිරීම ගැන විරෝධතාවයක් දැක්වීමට අදහස් කරන මාවනැල්ල නගර සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුට ඔහුගේ හෝ ඇගේ විරෝධතාවය සඳහා, හේතු පිටපත් දෙකකින් යුක්තව ලියවිල්ලකින් මෙම ගැසට් පත්‍රයේ සඳහන් දිනයේ සිට දින දහ හතරක් (14) ඇතුළත මා වෙත එවන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

උපලේඛනය

| අයදුම්කරුගේ නම | ස්ථානය |
|---|---|
| එච්. ඇල්. ඒ. සමාඩ් | කිරිංගදෙනිය, මාවනැල්ල. මාවනැල්ල පොදු වෙළඳ පලේ අංක 5 දරණ එළුමස් කඩය. |

පියතිස්ස රණසිංහ,
මාවනැල්ල නගරයේ විශේෂ කොමසාරිස්.

1974.12.31 දින,
මාවනැල්ල නගරයේ,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

1—418—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### කැළණිය සුළු නගර සභාව

1975 වර්ෂයේ වරිපනම් බදු ලේඛණ

1975 වර්ෂය සඳහා වූ කැළණිය සුළු නගර සභාවේ වරිපනම් ලේඛණ දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛණ කාර්යාල වේලාවන් හිදී පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බවත් (256 අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 165 වැනි වගන්තියෙන් කියවෙන පරිදි (252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 235(1) වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

ඩබ්ලිව්. කේ. ඩී. සිරිසේන,
කැළණිය සුළු නගර සභාවේ සභාපති.

1974 දෙසැම්බර් මස 15 වෙනි දින,
කැළණිය සුළු නගර සභා කාර්යාලයේ දීය.

1—419/1—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### කැළණිය සුළු නගර සභාව

1975 වර්ෂය සඳහා වරිපනම් බදු

256 වන අධිකාරය වන සුළු නගර සභා ආඥාපනත යටතේ 1974 වර්ෂයට පනවා තිබූ වරිපනම් බදු 1975 වර්ෂයට ද එලෙසම මෙම නගර සභා සීමාව තුළ පැනවීමට කැළණිය සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ 159 වැනි වගන්තිය ප්‍රකාර මෙම නගර සභා සීමාව තුළ පිහිටා ඇති කුඹුරු හා තණකොළ කොටු හැර, සියළුම නිශ්චල දේපලවල වටිණාකමෙන් සියයට හයක් (6%) වූ වාර්ෂික වරිපනම් බදු පිළිවෙළින් මාර්තු 31 දායින්, ජූනි 30 දායින්, සැප්තැම්බර් 30 දායින් හා දෙසැම්බර් 31 දායින් අවසන් වන අයුරින් ත්‍රෛමාසික වශයෙන් ගෙවිය යුතුවේ.

ඩබ්ලිව්. කේ. ඩී. සිරිසේන,
කැළණිය සුළු නගර සභාවේ සභාපති.

1974 දෙසැම්බර් මස 15 වෙනි දින,
කැළණිය සුළු නගර සභා කාර්යාලයේ දීය.

1—419/2—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### කැළණිය සුළු නගර සභාව—කොළඹ දිස්ත්‍රික්කය

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උප ලේඛනයේ සඳහන් අය විසින් 1975 වර්ෂයට මස් කඩ පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලුම් කර සිටින බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන කැළණිය සුළු නගර සභා ප්‍රදේශය තුළ යම් කෙනෙක් විරුද්ධවන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුතු ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, ගෝඝාතක ආඥා පනතේ 201 වැනි ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 ආඥා පනතින් සංශෝධනය වූ අංක 6 දරණ ආඥා පනත යටතේ මෙයින් දැනුම් දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| පී. දොන් වින්ස්ටන් මහතා ... | හරක්මස් වෙළඳාම, ඌරුමස් වෙළඳාම, එළු මස් වෙළඳාම | පිලපිටිය |
| එම්. ඒ. එස්. මොහිදීන් මයා. ... | හරක්මස්, ඌරුමස්, එළුමස් වෙළඳාම | ... කැළණිය |
| එම්. ඒ. එස්. මොහිදීන් මයා. ... | හරක්මස්, එළුමස්, වෙළඳාම | ... තොරණ හන්දිය අංක 1. |

74.12.15

ඩබ්. කේ. ඩී. සිරිසේන
සභාපති, කැළණිය සුළු නගර සභාව.

1—420—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### කැළණිය සුළු නගර සභාව

1975 වර්ෂයේ දානබයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වෙනි අධිකාරය)

477 වන අධිකාරය වන සුනඛයින් ලියා පදිංචි කිරීමේ ආඥා පනතේ 4 වන වගන්තියේ ප්‍රකාර කැළණිය සුළු නගර සභා බලමණ්ඩලය තුළ තබාගෙන සිටින සෑම පිරිමි සුනඛයින් සඳහා රුපියල් 1.00 බැගින් ද ගැණු සුනඛයින් සඳහා රුපියල් 1.50 බැගින් ද 1975 ජූනි මස 01 දා හෝ ඊට පෙර ගෙවන අයුරින් ලියා පදිංචි කිරීමේ ගාස්තු වක් 1975 වර්ෂය සඳහා අය කිරීමට පනවා ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩබ්ලිව්. කේ. ඩී. සිරිසේන,
සභාපති,
කැළණිය සුළු නගර සභාව.

74.12.15

1—421/1—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

### කැලණිය සුළු නගර සභාව

**(සුළු නගර සභා ආඥා පනත 256 වෙනි පරිච්ඡේදය) 1975 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද**

කැලණිය සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

1. සුළු නගර සභා ආඥා පනතේ (256 වැනි පරිච්ඡේදයේ) අංක 161 දරණ වගන්තිය යටතේ පහත උපලේඛනයේ එම වාහන සහ සතුන් ඉදිරියෙන් සඳහන් කර තිබෙන ගණන් අනුව එම වාහන හා සතුන් පිළිබඳ බද්දක් ගෙවිය යුතු 1974 වර්ෂයට මෙන්ම 1975 වර්ෂයටද පනවා ඇති බව සහ,

2. යථෝක්ත ආඥා පනතේ 162 (3) වෙනි වගන්තිය යටතේ එකී බදු 1975 මාර්තු මස 31 වෙනිදා හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් ය.

ඩබ්ලිව්. කේ. ඩී. සිරිසේන,
සභාපති,
කැලණිය සුළු නගර සභාව.

#### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| හැම පාපැදියක්ම ... ... ... | 1.00 |
| (අ) වෙළඳාම පිණිස කෙරේ නම් ... ... | 2.00 |
| (ආ) වෙළඳාමට හැර වෙන කටයුතු සඳහා කෙරේනම්... | 1.00 |
| (ඇ) හැම කරත්තයක් හෝ රික්ෂෝ රථයක් සඳහා ... | 2.00 |
| (ඈ) තනි ගොනා බැඳි හැම බර භාගයක් හා තිරික්කලයක් සඳහා ... ... ... | 2.50 |
| (ඉ) ගොන් දෙන්නා බැඳි හැම කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 5.00 |
| (ඊ) අශ්වයකු සඳහා ... ... ... | 5.00 |
| (උ) අලියෙකු හෝ ඇතකු සඳහා ... ... | 10.00 |

1–421/2—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### බේරුවල්–අළුත්ගම්–මාලේවන් බදු ගම්ප්‍රදේශය

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත විස්තර දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් එහි සඳහන් කර ඇති ස්ථානයේ මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1975 වර්ෂය වෙනුවෙන් බලපත්‍ර ලබා ගැනීමට අයදුම් පතක් ඉදිරිපත් කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් බේරුවල්–අළුත්ගම්–මාලේවන් බදු ගම් ප්‍රදේශය තුල පදිංචි කිසිවෙකු විරුද්ධ වන්නේ නම් ඒ කුමන කාරණයක් නිසාද යනවග ඇතුළත් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට දින 14 ක් ඇතුලත මා වෙත දන්වා එවිය යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (272 වැනි අධිකාරිය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම් කරන ස්ථානය හා ස්වභාවය | ඝාතනය කරන ස්ථානය |
|---|---|---|
| එම්. අයි. එම්. ජිප්රි, කොළණිය, බේරුවල ... | පිටවල, මණ්ඩාවලවත්ත ... | පිටවල, මණ්ඩාවලවත්ත |
| ඇම්. ඇස්. අමන්, කුරුඳුවත්ත පාර, දර්ගානගරය ... | වරාපිටිය, කුරුඳුවත්ත ... | |
| ඇම්. ඒ. අබ්දුල් රහීම්, සාවියා පාර, මහගොඩ, බේරුවල ... | හෙට්ටිමුල්ල, වඳකහවෙල, හිරිගල්කට්ටිය ... | හෙට්ටිමුල්ල, වඳකහවෙල, හිරිගල් කට්ටිය |

1975 ජනවාරි 1 දින,
පාඩගොඩ ගම්සභා කායර්‍යාලයේ දීය.

ඩී. ඒ. ආරියනන්ද,
බේරුවල් අළුත්ගම් මාලේවන් බදු ගම්සභාවේ සභාපති.

1–428—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### අනුරාධපුර දිස්ත්‍රික්කයේ කල්පේ කෝරලේ ගම සභාව

**ගෝඝාතක ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන අය විසින් එළ හරක් මස් වෙළඳාම පිණිස 1975 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන අනුරාධපුර දිස්ත්‍රික්කයේ කල්පේ කෝරලයේ ගම සීමාව තුළ පදිංචි යම් අයෙක් හෝ අයවළුන් විරුද්ධ වන්නේ නම් ඒ විරුද්ධවීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දන්වීම ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුලත මා වෙත ලියා එවිය යුතු බවත් ගෝඝාතක ආඥාපනතේ (272 අධිකාරිය) 7(2) වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම් කරුගේ නම හා ලිපිනය | වෙළඳාම | යෝජිත ස්ථානය |
|---|---|---|
| එක්. කමල්දීන්, මුක්කරවැව, හොරොව්පොතාන ... | එළහරක් මස් වෙළඳාම ... | හොරොව්පොතාන |

කල්පේ කෝරලේ ගම් සභාව,
හොරොව්පොතාන,
1975.01.01.

කේ. වී. පුංචිබණ්ඩා,
කල්පේ කෝරලේ ගම් සභාවේ සභාපති තැන.

1–623—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### වැල්ලවාය ගම්සභාව

**ගෝ ඝාතක ආඥා පනත (272 වෙනි අධිකාරය)**

මෙහි පහත දැක්වෙන උපලේඛණයේ සඳහන් අය විසින් ඒ අයගේ නම ඉදිරියෙන් සඳහන් ස්ථානයෙහි මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1975 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බව ගෝඝාතක ආඥාපනතේ (සංශෝධිත ලංකා ව්‍යවස්ථා ප්‍රඥප්තියේ 272 වෙනි අධිකාරය) 7(2) වෙනි වගන්තිය ප්‍රකාර මෙයින් දනුම් දෙනු ලැබේ.

එම බලපත්‍රය නිකුත් කිරීම ගැන විරෝධතාවයන් දැක්වීමට අදහස් කරන වැල්ලවාය ගම්සභා ප්‍රදේශ සීමාව තුල පදිංචි ඕනෑම කෙනෙකුට ඔහුගේ හෝ ඇගේ විරෝධතාවය සඳහා හේතු පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින්, මෙම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින දහ හතරක් (14) ඇතුලත මා වෙත එවනමෙන් මෙයින් ඉල්ලා සිටිමි.

#### උප ලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| ජේ. ඒ. ඇම්. ආරිප්, අංක 8, පොදුවෙළඳපොල, වැල්ලවාය | වැල්ලවාය පොදු වෙළඳ පොල ... | ගවමස් සහ එළු මස් |

1975 ජනවාරි මස 07 වන දින,
වැල්ලවාය,
ගම්සභා කාර්යාලයේදීය

ආර්. ඩබ්ලිව්. ඒ. ඩී. රණසිංහ,
වැල්ලවාය ගම්සභාවේ සභාපති,

1–625—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

## වැල්ලව ගම්සභාව

### සෝගාතක ආඥපනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් අයවලුන් විසින් ඒ ඒ අයගේ නම ඉදිරියෙහි විස්තර සඳහන්වන ස්ථානයන්හි මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1975 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන විරුද්ධ වන් වැල්ලව ගම්සභා සීමාව තුල පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධවන්නේ නම් අසවල් එකරුණු මතයැයි දක්වෙන පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් මෙම දන්වීම ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත එවන ලෙසත්, සෝගාතක ආඥපනතේ (272 අධිකාරය) 7 (2) වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දනුම්දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| යූ. එම්. ෂහීඩ් | ... මල්ලවපිටිය, නුවර පාර 110 | ... එළුහරක් මස් |
| ඒ. එම්. එම්. බුහාරි | ... මල්ලවපිටිය, නුවර පාර 70 | ... එළුහරක් මස් |
| ඇස්. ඇල්. මොහෙමඩ් | ... තෝරයාය, කුඩාගල්වැටිය වත්ත | ... එළුහරක් මස් |
| ඒ. එස්. හමීර් | ... මල්ලවපිටිය හංදිය 35/10 | ... එළුහරක් මස් |
| එම්. සී. එම්. මීරාසහිබ් | ... යග්ගෙමිටිය, දිවල වත්ත | ... එළුහරක් මස් |
| කේ. නුහුලෙබ්බෙ | ... වැල්ලව පොදු වෙළඳපොල | ... එළුහරක් මස් |
| එම්. සී. එම්. මීරාසයිබ් | ... මල්ලවපිටිය, නුවර පාර 5/4 | ... කුකුල් මස් |

කේ. පී. ජයසේන,
වැල්ලව ගම්සභාවේ සභාපති.

වැල්ලව ගම්සභා කාර්යාලය,
මරලුවාව, කුරුණෑගල. 1974.12.27.

1-422—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

## බදුල්ල නාගරිකය

### ගෝඝාතක ආඥපනත (272 වැනි අධිකාරය)

බදුල්ල නාගරිකයේ විශේෂ කොමසාරිස්, හේරත් මුදියන්සේලාගේ අබේපාල වන මම, (272 වැනි අධිකාරය වන) ගෝඝාතක ආඥපනතේ 17(1) දරන ඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 1975 වර්ෂයේ පහත දක්වා ඇති 'ඒ' උපලේඛනයේ සඳහන් දිනවල බදුලු නාගරික සීමාව තුළ සත්ව ඝාතනය සහ මස් වෙළඳාම මෙයින් තහනම් කරන බවත්, 'බී' උපලේඛනයේ සඳහන් දිනවල සත්ව ඝාතනය තහනම් කරන බවත්, මෙයින් දනුම් දී සිටිමි.

'ඒ' උපලේඛනය

1. සියලුම පසළොස්වක පෝය දිනයන්.
2. තයිපොංගල් දිනය.
3. මහ සිව රාත්‍රි දිනය.
4. මහ සිකුරාද දිනය.
5. ජනරජ දිනය.
6. වෙසක් පෝය දිනයට පසු දිනය.
7. ලෝක සත්ව දිනය.
8. බණ්ඩාරනායක ගුණානුස්මරණ දිනය.

'බී' උපලේඛනය

පහත සඳහන් පෝය දිනයන් :—

1975 ජනවාරි 5, 12 හා 20.
1975 පෙබරවාරි 3, 11 හා 19.
1975 මාර්තු 5, 13 හා 21.
1975 අප්‍රේල් 3, 11 හා 19.
1975 මැයි 9, 11 සහ 18.
1975 ජූනි 2, 10 හා 16.
1975 ජූලි 1, 9, 16 හා 31.
1975 අගෝස්තු 7, 14 හා 30.
1975 සැප්තැම්බර් 6, 12 හා 28.
1975 ඔක්තෝබර් 5, 12 හා 28.
1975 නොවැම්බර් 3, 10 හා 26.
1975 දෙසැම්බර් 3, 10 හා 25.

එච්. එම්. අබේපාල,
බදුලු නාගරිකයේ විශේෂ කොමසාරිස්.

විශේෂ කොමසාරිස් කාර්යාලය,
බදුල්ල, 1974. 12. 31.

1-425—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

## දෙහිඕවිට සුළු නගර සභාව—ගෝඝාතක ආඥපනත

මෙහි පහත සඳහන් උප ලේඛනයෙහි දක්වෙන අය එහි සඳහන් ස්ථානයන්හි 1975.01.01 දින සිට 1975.12.31 වැනි දින දක්වා කාලයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍ර ඉල්ලා මා වෙත අයදුම් පත් ඉදිරිපත් කර ඇති බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 272 වන අධිකාරය 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන දෙහිඕවිට සුළු නගර සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇ එසේ විරුද්ධ වන්නේ කුමන කරුණු නිසාද යන වග සඳහන් විලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දන්වීම ගැසට් පත්‍රයෙහි පළවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත එවිය යුතු බව මෙයින් දනුම් දෙනු ලැබේ.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. ඇන්. ඩී. ඇම්. මුබාරක්, අංක 195, මහවීදිය, යටියන්තොට | ගවමස් | ... දෙහිඕවිට අංක 143 දරණ මස් කඩය |
| 2. ඒ. ඇම්. අස්සාර්, අංක 98, දෙහිඕවිට | ... එළුමස් | ... දෙහිඕවිට අංක 141 දරණ එළුමස් කඩය |
| 3. ටී. ඇම්. වයි. ෂාවුල්හමීඩ්, අංක 343, තල්දූව, අවිස්සාවේල්ල | ගවමස් | ... තල්දූව අංක 1 දරණ හරක් මස් කඩය |
| 4. ඒ. එම්. ජෙමල්ඩීන්, අංක 510, තල්දූව, අවිස්සාවේල්ල... | ගවමස් | ... තල්දූව අංක 2 දරණ හරක් මස් කඩය |

1974 දෙසැම්බර් මස 30 වෙනි දින,
දෙහිඕවිට සුළුනගර සභා කාර්‍යාලයේ දීය.

පියතිස්ස රණසිංහ,
පාලන නිලධාරි, දෙහිඕවිට සුළු නගර සභාව.

1-427—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

### කුරුවිට කෝරළේ මැද පත්තු ගම්සභාව—රත්නපුර දිස්ත්‍රික්කය

#### ගෝඝාතන ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ දක්වෙන අය විසින් 1975 වර්ෂයට මස් කඩයක් පවත්වා ගෙන යෑම සඳහා බලපත්‍ර ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන කුරුවිට කෝරළේ මැද පත්තු ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක්, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුලත මා වෙත ලියා එවියයුතු බවත්, ගෝඝාතන ආඥාපනතේ (272 අධිකාරය) 7 වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම | වෙළඳාම් කරන ස්ථානය |
|---|---|---|---|
| 1. | ඇස්. ඇම්. ඇම්. මුසම්මිර් ... | හරක් මස් ... | ඉඩන්ගොඩ පොදු වෙළඳ සැලේ අංක 7 දරණ කඩකාමරය |

බී. ජී. ගෝවින්දපාල,
පාලන නිලධාරි,
කුරුවිට කෝරළේ මැද පත්තු ගම්සභාව.

ගම්සභා කාර්යාලයය,
කිරිඇල්ල, 1975.01.01
1–449—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### හංවැල්ල උඩුගහපත්තු ගම්සභාව—කොළඹ දිස්ත්‍රික්කය

#### ගෝඝාතක ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් එහි දක්වෙන ස්ථානයන්හි 1975 වර්ෂය තුළ මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍රයක් ඉල්ලුම්කර ඇති බවත් ඒ අනුව එකී බල පත්‍රය නිකුත් කිරීම ගැන හංවැල්ල උඩුගහපත්තු ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කොට පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලැබෙන්නට සැළැස්විය යුතු බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|---|
| 1. | ආර්. ජේ. ඩී. ජෙරමියස් මහතා, වනහගොඩ, හංවැල්ල ... | කළුඅග්ගල මංසන්ධියේ පිහිටි මස්කඩය ... | හරක් මස් හා එළු මස් |
| 2. | ආර්. ජේ. ඩී. ජෙරමියස් මහතා, වනහගොඩ, හංවැල්ල... | කහහේන ප්‍රසිද්ධ වෙළඳ පොලේ පිහිටි මස්කඩය ... | හරක් මස් හා එළු මස් |
| 3. | ආර්. ජේ. ඩී. ජෙරමියස් මහතා, වනහගොඩ, හංවැල්ල... | කොස්ගම ප්‍රසිද්ධ වෙළඳ පොලේ පිහිටි මස්කඩය ... | හරක් මස් හා එළු මස් |

පී. ඇල්. ඇස්. අල්විස්,
පාලන නිලධාරි,
හංවැල්ල උඩුගහපත්තු ගම්සභාව.

ගම්සභා කාර්යාලය,
බොරළුගොඩ, කොස්ගම.
1974 දෙසැම්බර් මස 31 දින.

1–442–75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### කොස්ගොඩ ගම්සභාව

#### ප්‍රාදේශීය බලමණ්ඩල (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

261 වැනි අධිකාරිය වන ප්‍රාදේශීය බලමණ්ඩල (සම්මත අතුරු ව්‍යවස්ථා) පණතේ 3 වැනි වගන්තිය යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ කොස්ගොඩ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තිය ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

#### යෝජනාව

1953 අප්‍රියෙල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල 18 වැනි කාණ්ඩයෙහි අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදාළ අතුරු ව්‍යවස්ථා සංශෝධනය කරමින් රාජ්‍ය පරිපාලන, පලාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිතුමා විසින් සම්පාදනය කරනු ලැබ 1972 මාර්තු මස 10 වැනි දින අංක 15,001 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද, ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරන ලද බව 1972 ඔක්තෝබර් 27 වන දින අංක 31 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූ අතුරු ව්‍යවස්ථාව මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර පිළිගැනීමට මෙයින් යෝජනා කරනු ලැබේ.

එම්. ජී. ද සිල්වා,
සභාපති,
කොස්ගොඩ ගම්සභාව.

1974 ක්වූ දෙසැම්බර් මස 30 වැනි දින,
අහුන්ගල්ල පිහිටි කොස්ගොඩ ගම්සභා කාර්‍යාලයේදීය.
1-441—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය.

---

### දෙහිවත්ත ගම්සභාව

#### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත විස්තර දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් 1975 වර්ෂය සඳහා සතුන් මරා විකිණීම සඳහා බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත් ඒ අනුව බල පත්‍රය නිකුත් කිරීම ගැන දෙහිවත්ත ගම්සභා ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14ක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරණ සංශෝධනය කරන ලද ආඥාපනතේ 6 වන වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | සතුන් මරණ ස්ථානය | ස්වභාවය |
|---|---|---|
| ඒ. සී. පෙරේරා ... | ඇල්. බී. 1 සෝමපුර, ඩී. ඒ. පියදස මහතාට අයත් ඉඩම—අංකය 67 | හරක් මස් හා ඌරු මස් |

කේ. ඒ. ද සිල්වා,
සභාපති, දෙහිවත්ත ගම්සභාව.

ගම්සභා කාර්යාලය,
දෙහිවත්ත.
1975.1.1

1–478–75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

### බදුල්ල දිස්ත්‍රික්කය—ඌව බින්තැන්න ගම් ප්‍රදේශය

### මස් පිණිස සතුන් මැරීමේ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් එහි දක්වෙන ස්ථානයන්හි 1975 වර්ෂය තුල මස්කඩ පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ඉල්ලුම්කර ඇති බවත්, මෙම ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීම ගැන බදුල්ල දිස්ත්‍රික්කයේ ඌව බින්තැන්න ගම් ප්‍රදේශය තුල පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම් එය විස්තර සහිතව ලියවිල්ලකින් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින දහ හතරක් (14) ඇතුලතදී මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බැව් (272 වැනි අධිකාරය වන) මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ. එම්. එම්. බී. අභයසිංහ,
පාලන නිලධාරි තැන්, ඌව බින්තැන්න ගම් ප්‍රදේශය, මහියන්ගනය.

1974 දෙසැම්බර් මස 31 දින,
ඌව බින්තැන්න ගම් ප්‍රදේශයේ පාලන නිලධාරි කාර්යාලයය,
මහියන්ගනය,

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම් කරන ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. ඌනා මොහම්මදු ඉස්මයිල්, පගරගම්මන, මාපාකඩවැව ... | පගරගම්මන ... ... | හරක් මස් කඩය |
| 2. එච්. ඇල්බට් ප්‍රනාන්දු, හෙබරව, මහියන්ගනය ... | අලුත්තරම ... ... | හරක් මස් කඩම |
| 3. එස්. එම්. සාදිකින්, කුඹුක්කඳුර, තෙල්දෙනිය ... | මහියන්ගන පොදු වෙළඳ පොලේ අංක 1 දරණ කඩ කාමරය | හරක් මස් කඩය |
| 4. ඒ. ආර්. එම්. හාසිම්, නො. 193, නාවලපිටිය පාර, උලපනේ | මහියන්ගන පොදු වෙළඳ පොලේ අංක 2 දරණ කඩ කාමරය | හරක් මස් කඩය |
| 5. එස්. එම්. සතාර්, නො. 3/2; පාරතොට පාර,, කහටපිටිය, ගම්පොල | මහියන්ගන පොදු වෙළඳ පොලේ අංක 3 දරණ කඩ කාමරය | එළු මස් කඩය |

1–439—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### රත්නපුර මහ නගර සභාව

#### 1975 වර්ෂය සඳහා වාහන හා සතුන් බද්ද

රත්නපුර මහ නගර සභාව විසින් —

(1) මහ නගර සභා ආඥාපනතේ (252 වන අධිකාරය) අංක 245 (1) දරණ වගන්තිය යටතේ 1975 වර්ෂයට වාහන හා සතුන් වෙනුවෙන් පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් කර ඇති බද්ද පනවා ඇති බවත්,

(2) එම ආඥාපනතේ අංක 245 (2) දරණ උප වගන්ති යටතේ මෙම බදු මුදල් 1975 මාර්තු 31 වැනි දිනට ප්‍රථම ගෙවිය යුතු බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. ඩබ්ලිව්. සමරතුංග,
නාගරික කොමසාරිස්,
රත්නපුර මහ නගර සභාව.

1975 ජනවාරි මස 02 වැනි දින,
රත්නපුර, මහ නගර සභා කාර්යාලයයේදීය.

#### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, රෝද තුනේ මෝටර් රියක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, අත් කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක්, රෝද තුනේ බයිසිකලයක් හැර අන් ඕනෑම වාහනයක් ... | 5 | 0 |
| සෑම බයිසිකලයක්, ට්‍රයිසිකලයක්, බයිසිකල් කාරයක් හෝ ට්‍රයිසිකල් කාරයක් හෝ කරත්තයක්— | | |
| (අ) වෙළඳාම පිණිස පාවිච්චි කිරීමේදී ... | 5 | 0 |
| (ආ) අන් අන්දමකට පාවිච්චි කිරීමේදී ... | 1 | 50 |
| සෑම කරත්තයකට ... ... | 3 | 0 |
| සෑම අත් කරත්තයකට ... ... | 5 | 0 |
| ජින් රික්ෂෝවකට ... ... | 2 | 0 |
| සෑම අශ්වයකු, අශ්වතරයෙකු හෝ කොටළුවෙකුට ... | 2 | 0 |
| සෑම ගොනෙකු හෝ බූරුවෙකුට ... ... | 2 | 0 |

1–450/1—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### රත්නපුර මහ නගර සභාව

#### 1975 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු

**සංශෝධිත ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 477 වන අධිකාරයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත**

රත්නපුර මහ නගර සභාව විසින් සංශෝධිත, ලංකා ප්‍රඥප්ති සංග්‍රහයේ 477 වන අධිකාරයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥා පණතේ 4 වැනි වගන්තිය ප්‍රකාර, රත්නපුර මහ නගර සභා පාලන සීමාව තුල තබා ගන්නා සෑම බල්ලෙකුටම රු. 2 ක හා සෑම බැල්ලියකට රු. 2.50 ක ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් 1975 වර්ෂයට පනවා ඇති බවත්, එකී ගාස්තු 1975 මාර්තු 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ඩබ්ලිව්. සමරතුංග,
රත්නපුර නාගරික කොමසාරිස්.

1975 ජනවාරි මස 02 වැනි දින,
රත්නපුර, මහ නගර සභා කාර්යාලයයේදීය.

1–450/2—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### කුරුණෑගල දිස්ත්‍රික්කයේ රම්බඩගල්ල ගම්සභාව

#### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උප ලේඛනයේ සඳහන් අය විසින් 1975 වර්ෂයට එළ හරක් මස් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යැම සඳහා බලපත්‍ර ඉල්ලා මා වෙත අයදුම් පත් ඉදිරිපත් කර ඇති බවත්, එම බල පත්‍රය නිකුත් කිරීම සම්බන්ධයෙන් රම්බඩගල්ල ගම්සභා පාලන බල සීමාව තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් මෙම දැන්වීම පළවූ දින සිට දින 14ක් ඇතුලත එකී විරුද්ධවාදිකම් ඉදිරිපත් කල යුතු බව 1947 අංක 44 දරණ ගෝඝාතක ආඥාපනතේ (272 වෙනි අධිකාරය) අංක 6 දරණ ආඥාපනතින් සංශෝධිත (7) වෙනි වගන්තියේ (2) වෙනි උප වගන්තියේ පරිදි මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උප ලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| පී. හමීම්, හාලියාමුල්ල, පානගමුව ... ... | එළ හරක් මස් ... | පානගමුව, පොල්වත්ත |

ඩී. ඇම්. ටී. බී. දිසානායක,
රම්බඩගල්ල ගම්සභාවේ පාලන නිළධාරි,

1975.01.01 වෙනි දින,
රම්බඩගල්ල ගම්සභා කාර්යාලයේදීය.

1–453—75.01.17දින අංක 147 දරණ ගැසට් පත්‍රය

### අනුරාධපුර දිස්ත්‍රික්කයේ උතුරු මාමිණියා කෝරළේ ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් අයවලුන් විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1975 වර්ෂය සඳහා බලපත්‍රයක් ඉල්ලුම් කර සිටිනු බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධව උතුරු මාමිණියා කෝරළේ ගම්සභා බල ප්‍රදේශය තුල පදිංචි ඕනෑම කෙනෙකු හට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණු සඳහා යයි දක්වෙන ලියවිල්ලක පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරණ්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිත වූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| නම | | වෙළඳාම කරන ස්ථානය | | වෙළඳාම |
|---|---|---|---|---|
| එම්. රසීදු | ... ... ... | මරදන්කඩවල කඩ වීදිය | ... | එළ හරක් මස් |
| එම්. එම්. ඒ. ලතීප් | ... ... | ගනේවල්පොල කඩ වීදිය | ... | එළ හරක් මස් |

කේ. ඒ. පොඩිඅප්පුහාමි,
ප්‍රධාන තැන,
උතුරු මාමිණියා කෝරළේ ගම්සභාව,
මරදන්කඩවල.

1975.01.02 දින දිය.

1–452—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### හම්බන්තොට නගර සභාව

### ගෝසාතක ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයෙහි දක්වෙන අය එහි සඳහන් ස්ථානයන්හි 1975.01.01 වැනි දින සිට 1975.12.31 වැනි දින දක්වා වන කාලයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍රයක් ඉල්ලා මා වෙත අයදුම් පත්‍ර ඉදිරිපත් කර ඇති බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වන අධිකාරයෙන් 7 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍ර නිකුත් කිරීම ගැස හම්බන්තොට නගර සභා සීමාව තුළ යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන කරුණු නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | | වෙළඳාම | | ස්ථානය |
|---|---|---|---|---|
| ඒ. අයි. කබීර් මහතා, නො. 11, කුරුඳුවත්ත පාර, ධර්ගා නගරය | ... | ගවමස් වෙළඳාම | ... | ගවමස් වෙළඳ පිල් අංක 1, පොදු වෙළඳ සැල, හම්බන්තොට |
| ඒ. අයි. අලියාර් මහතා, නො. 11, කුරුඳුවත්ත පාර, ධර්ගා නගරය | ... | ගවමස් වෙළඳාම | ... | ගවමස් වෙළඳ පිල් අංක 2, පොදු වෙළඳ සැල, හම්බන්තොට |
| ඒ. කේ. ඇක්මන් මහතා, නො. 11, මහ වීදිය, මතුගම | ... | ගමවස් වෙළඳාම | ... | පානුවල වෙළඳ පිල, හම්බන්තොට |
| පී. එච්. මොහමඩ් මහතා, පානුවල, හම්බන්තොට | ... | එළුමස් වෙළඳාම | ... | එළුමස් වෙළඳ පිල අංක 3, පොදු වෙළඳ සැල, හම්බන්තොට |

එච්. ජී. ආනන්ද,
පාලන නිලධාරි,
හම්බන්තොට නගර සභාව.

1975 ජනවාරි මස 1 වෙනි දින,
හම්බන්තොට නගර සභා කාර්යාලයේ දීය.

1–476—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### මාළිම්බඩ ගම්සභාව

### (ගෝසාතන ආඥාපනත "272 වැනි අධිකාරය")

මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් ඒ ඒ අයගේ නම ඉදිරියෙහි සඳහන් ස්ථානයන්හි මස් පිණිස සතුන් මරා මස් විකිණීම සඳහා 1975 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, එම බලපත්‍ර නිකුත් කිරීම ගැන මාළිම්බඩ ගම්සභාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ මතයයි දක්වෙන පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත එවන ලෙස ඉල්ලා සිටින අතර ගෝසාතන ආඥාපනතේ 272 වැනි අධිකාරයේ 7 (2) වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | | වෙළඳාම් කරණ ස්ථානය | | වෙළඳාම |
|---|---|---|---|---|---|
| 1. | පී. ඇම්. පලීල්, කපුවත්ත, දෙණිපිටිය, | ... .... | විඩහලවත්ත, කපුවත්ත, දෙණිපිටිය | ... | එළහරක් මස් හා එළු මස් |
| 2. | ඒ. ආර්. ඇම්. රපීලි, බෙරලැලිය, කොළෙද්දණ්ඩ, වැලිගම් | | පල්ලියවත්ත, බෙරලැලිය, කොළෙද්දණ්ඩ | ... | එළහරක් මස් හා එළු මස් |
| 3. | යූ. ඇල්. ඇම්. ෂරප්දීන්, හොරගොඩ, තෙලිජ්ජවිල | ... | බාරාලගෙවත්ත, තෙලිජ්ජවිල | ... | එළහරක් මස් හා එළු මස් |
| 4. | යූ. ඇල්. ඇම්. ෂරප්දීන්, හොරගොඩ, තෙලිජ්ජවිල | ... | දෙහිමුල්ලවත්ත, හොරගොඩ | ... | එළහරක් මස් හා එළු මස් |

ඇන්. ඒ. ගුණදස,
මාළිම්බඩ ගම්සභාවේ වැ.බ. සභාපති තැන.

1–477—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

## අතුරුගිරිය ගම්සභාව

### ගෝඝාතක ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වෙන අයවළුන් විසින් එළහරක් මස් විකිණීම සඳහා 1975 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන, අතුරුගිරිය ගම්සභා සීමාව තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධවන්නේ නම් එසේ විරුද්ධවීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක්, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවිය යුතු බවත්, ගෝඝාතක ආඥාපනතේ (272 අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරු | වෙළඳාම | වෙළඳාම් කරන ස්ථානය |
|---|---|---|
| 1. ජී. සෝමපාල ... ... ... | එළහරක් මස් ... | හිඟුරුපත්වලදෙනිය, අතුරුගිරිය |
| 2. එන්. එම්. උබයිදුල්ලා ... ... | එළහරක් මස් ... | ගොන්නගහවත්ත, කොට්ටාව |

එච්. එස්. පෙරේරා,
සභාපති
අතුරුගිරිය ගම්සභාව.

1975.01.01 වෙනි දින,
අතුරුගිරිය ගම්සභා කාර්යාලයේ දීය.

1–482—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

## මිණුවන්ගොඩ නගර සභාව

### සෝඝාතක ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් 1975 වර්ෂයට එහි සඳහන් ස්ථානයන්හි මස්කඩ පවත්වා ගෙන යාමට බලපත්‍ර ඉල්ලුම්කර ඇති බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන මිණුවන්ගොඩ නගර සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය ඇති බවත්, සෝඝාතක ආඥාපනත යටතේ (272 වෙනි අධිකාරය) 7 වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | වෙළඳාම් කරන ස්ථානය |
|---|---|---|
| 1. යූ. ඇල්. ෂෙල්ටන් ඔගස්ටා පෙරේරා, පන්සිල්ගොඩ, මිණුවන්ගොඩ | ඌරුමස් ... | මිණුවන්ගොඩ මධ්‍යම වෙළඳ සැලේ ඌරුමස් කඩය |
| 2. ඇම්. ඇම්. මර්සූන්, 5, කෝපිවත්ත, මිණුවන්ගොඩ ... ... | එළුමස් ... | මිණුවන්ගොඩ නව වෙළඳ සැලේ අංක 2 දරණ එළුමස් කඩය |

ජී. ආර්. සේනානායක,
මිණුවන්ගොඩ නගර සභාවේ
සභාපති.

1975 ජනවාරි මස 02 වෙනි දින,
මිණුවන්ගොඩ නගර සභා කාර්යාලයේ දීය.

1–484—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

## විශේෂ කොමසාරිස් කාර්යාලය—බේරුවල නගරය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයෙහි නම් සඳහන් අයවළුන් විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම සඳහා 1975 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, එම බලපත්‍ර නිකුත් කිරීම ගැන විරුද්ධව බේරුවල නගර සභාව තුල පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ ගැන විරුද්ධ වන්නේ අසවල් කරුණු සඳහා යයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙක්කින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දිනයේ සිට දින 14 ක් ඇතුලතදී මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරය) 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

මද්දුම බංඩා හේරත්,
විශේෂ කොමසාරිස්,
බේරුවල නගරය,

1975 ජනවාරි මස 2 වන දින,
බේරුවල නගරයේ,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | බලපත්‍රයේ විස්තර | ස්ථානය |
|---|---|---|
| 1. එම්. පී. සාහුල් හමීඩ් ... | ගවමස් වෙළඳාම ... | අංක 1, ගවමස් කඩය, ප්‍රසිද්ධ වෙළඳ පොළ |
| 2. එම්. පී. සාහුල් හමීඩ් ... | එම ... | අංක 2, ගවමස් කඩය, ප්‍රසිද්ධ වෙළඳ පොළ |
| 3. ඒ. ඇම්. අබුසාලි ... ... | එම ... | අංක 3, පරණ පාර, බේරුවල |
| 4. එම්. පී. සාහුල් හමීඩ් ... | එම ... | අංක 4, පිටවල, බේරුවල |
| 5. එම්. පී. සාහුල් හමීඩ් ... | එළු මස් වෙළඳාම ... | එළු මස් කඩය, ප්‍රසිද්ධ වෙළඳ පොළ |

1–483—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

### බේරුවල නගරය

### 1975 වර්ෂයේ දේපල බද්ද

### පළාත් ආණ්ඩු සහා ආඥාපනතේ (255 වෙනි පරිච්ඡේදය)

පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ 255 වෙනි පරිච්ඡේදය යටතේ බේරුවල නගරයේ විශේෂ කොමසාරිස් විසින් බේරුවල නගර සභා පාලන සීමාව තුළ ඇති සියළුම නිශ්චල දේපල සඳහා 1975 වර්ෂයට වාර්ෂික තක්සේරුවෙන් 12% ක දේපල බද්දක් පැනවීම වත්, එම බදු මුදල් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 දැයින් අවසන් වන සමාන කාර්තු 4 කින් අය කරන බවත්, මෙයින් දැනුම් දෙමි. මෙම බද්ද පසුගිය වර්ෂයේ දේපල බද්දට සමානය.

මද්දුම බංඩා හේරත්,
විශේෂ කොමසාරිස්,
බේරුවල නගරය.

1974. 12. 19 වන දින,
බේරුවල නගරයේ,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

1-458 —75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### පිළියන්දල සුළු නගර සභාව

1975 වර්ෂය සඳහා පිළියන්දල සුළු නගර සභාවේ වරිපනම් ලේඛණ දැනට සූදානම් බවත්, එම ලේඛණ කාර්යාල වේලාවන් හිදී මෙම කාර්යාලයේදී පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බවත්, (256 වැනි අධිකාරය) සුළු නගර සභා ආඥාපනතේ 165 වැනි වගන්තියෙන් කියවෙන පරිදි (252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥා පනතේ 235 (1) දරණ වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

සී. දයා කුලරත්න,
සභාපති,
පිළියන්දල සුළු නගර සභාව.

1974 දෙසැම්බර් මස 17 වැනි දින,
පිළියන්දල සුළු නගර සභා කාර්යාලයේදීය.

1–459/1—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### පිළියන්දල සුළු නගර සභාව

### 1975 වර්ෂය සඳහා දේපල බද්ද

### නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය)

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනත යටතේ ගතුදී යන මෙම වර්ෂයට බලපවත්නා පහත සඳහන් බදු 1975 වර්ෂයටද එලෙසම පැනවීමට පිළියන්දල සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 (2) වැනි වගන්ති ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපල වල වාර්ෂික වටිනාකමින් සියයට පහ බැගින් වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 වැනිදාසින් අවසන් වන අයුරු කාර්තු වශයෙන් ගෙවිය හැකි වේ.

සී. දයා කුලරත්න,
සභාපති,
පිළියන්දල සුළු නගර සභාව.

1974 දෙසැම්බර් මස 17 වැනි දින
පිළියන්දල සුළු නගර සභා කාර්යාලයේදීය.

1–459/2—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### පිළියන්දල සුළු නගර සභාව

256 වන අධිකාරය වන සුළු නගර සභා ආඥාපනත—1975 වර්ෂය සඳහා රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද

පිළියන්දල සුළු නගර සභාවේ සභාපති විසින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ :—

(1) 256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ අංක 161 (1) දරණ වගන්තිය යටතේ පහත උපලේඛනයෙහි විස්තර වන ගණන් අනුව 1975 අවුරුද්දට රථ වාහන හා සතුන් සඳහා බද්දක් පණවා අය කිරීමටද,

(2) එකී ආඥාපනතේ 162 (3) වැනි වගන්තිය යටතේ එකී බදු 1975 මාර්තු 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම ගෙවිය හැකි අයුරින්ද වේ.

සී. දයා කුලරත්න,
සභාපති,
පිළියන්දල සුළු නගර සභාව.

1974 දෙසැම්බර් මස 18 වැනි දින,
පිළියන්දල සුළු නගර සභා කාර්යාලයේදීය.

### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, ලොරි, මෝටර් පාපැදි, අත් කරත්ත, රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙන ඕනෑම අන්දමේ වාහනයක් සඳහා ... ... | 5 | 0 |
| සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් හෝ රෝදත්‍රයේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක්— | | |
| (අ) වෙළදාම පිණිස පාවිච්චි කරන්නේ නම් ... | 3 | 0 |
| (ආ) වෙළදාමට හැර වෙන කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම් ... ... | 1 | 50 |
| ඕනෑම අන්දමක ගොන් දෙන්නා බැඳි සෑම බර කරත්තයක් සඳහා ... ... | 3 | 0 |
| තනි ගොනා බැඳි සෑම බරබාගයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 3 | 0 |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... | 2 | 0 |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... ... | 2 | 0 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ අශ්ව කරත්තයක් සඳහා ... ... ... | 3 | 0 |

1–459/3—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### පිළියන්දල සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

### ව්‍යාපාර බලපත්‍ර ගාස්තු

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 161 සහ 163 වගන්ති යටතේ පිළියන්දල සුළු නගර සභාවේ සභාපති වන මා විසින් මෙම උපලේඛනයේ විස්තර කරනු ලබන ව්‍යාපාර පබපත්‍රයක් වෙනුවෙන් එහි නිශ්චිත සඳහන් බලපත්‍ර ගාස්තු 1975 වර්ෂයේ ජනවාරි මාසයේ සිට ඉදිරියට බලපවත්වන ලෙස පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සී. දයා කුලරත්න,
සභාපති,

1974 දෙසැම්බර් මස 18 වැනි දින,
පිළියන්දල සුළු නගර සභා කාර්යාලයේදීය.

### උපලේඛනය

| බලපත්‍රයේ ස්වභාවය | වාර්ෂික බලපත්‍ර ගාස්තුව රු. | ශ. |
|---|---|---|
| තෙල් බලයෙන්, වාෂ්ප බලයෙන් හෝ විදුලි බලයෙන් ක්‍රියා කරන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාමට ... | 250 | 0 |
| සිසිල් බීම ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාමට ... | 20 | 0 |
| හෝටලයක් පවත්වාගෙන යාමට ... ... | 35 | 0 |
| බේකරියක් පවත්වාගෙන යාමට ... ... | 35 | 0 |
| තේ/කෝපි කඩයක් පවත්වාගෙන යාමට ... | 15 | 0 |
| කරණවෑමි මැදිරියක් පවත්වාගෙන යාමට ... | 20 | 0 |
| එළළුව ගබඩාවක් පවත්වාගෙන යාමට (ප්‍රසිද්ධ වෙළඳ පොළින් බැහැරව) ... ... ... | 12 | 0 |

| බලපත්‍රයේ ස්වභාවය | වාර්ෂික බලපත්‍ර ගාස්තුව රු. ශ. |
|---|---|
| මෝටර් රථ අළුත් වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාමට ... ... ... | 50 0 |
| වඩුමඩුවක් පවත්වාගෙන යාමට ... ... | 15 0 |
| වැල් ඕං වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාමට ... | 15 0 |
| දර මඩුවක් පවත්වාගෙන යාමට ... ... | 10 0 |
| රන් රිදී බඩු සාදන ස්ථානයක් පවත්වාගෙන යාමට ... | 25 0 |
| මුද්‍රණාලයක් පවත්වාගෙන යාමට ... ... | 50 0 |
| පොත් සාප්පුවක් පවත්වාගෙන යාමට ... ... | 20 0 |
| හුණු පෝරනුවක් පවත්වාගෙන යාමට ... ... | 25 0 |
| ඇඹරුම් හලක් පවත්වාගෙන යාමට ... ... | 50 0 |
| ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාමට ... ... | 50 0 |
| වයර් හා විදුලි වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාමට ... ... ... | 5 0 |
| මිණි පෙට්ටි වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාමට ... ... ... | 15 0 |
| බිඩී එතීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට ... | 15 0 |
| සිල්ලර වශයෙන් විකිණීම පිණිස ආහාර ද්‍රව්‍ය තබා ඇතිමේ ස්ථානයක් පවත්වාගෙන යාමට ... ... | 20 0 |
| රෙදි සාප්පුවක් පවත්වාගෙන යාමට ... ... | 50 0 |
| බයිසිකල් අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාමට ... ... ... | 10 0 |
| ලී මඩුවක් පවත්වාගෙන යාමට ... ... | 50 0 |
| ඇළුමිණියම් බඩු සහ තීන්ත වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාමට ... ... | 20 0 |
| බැට්රි චාජ් කරන ස්ථානයක් පවත්වාගෙන යාමට ... | 20 0 |
| වී මෝලක් පවත්වාගෙන යාමට ... ... | 35 0 |
| සුපත්තු සාදන ස්ථානයක් පවත්වාගෙන යාමට ... | 10 0 |
| කරවල ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාමට ... | 25 0 |
| පිටි ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාමට ... | 25 0 |
| ලුණු ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාමට ... | 15 0 |
| සිමෙන්ති ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාමට ... | 25 0 |
| සීනි ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාමට ... | 25 0 |
| රබර් දුම් ගෙයක් පවත්වාගෙන යාමට ... | 5 0 |
| කම්හලක් පවත්වාගෙන යාමට ... ... | 10 0 |
| භූමි තෙල් ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාමට... | 50 0 |
| ලොන්ඩරියක් පවත්වාගෙන යාමට ... ... | 10 0 |
| මාළු ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාමට ... | 25 0 |
| තොග බඩු ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාමට... | 100 0 |
| ගුවන් විදුලි යන්ත්‍ර අළුත් වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාමට ... ... | 25 0 |
| ගෘහ ලී බඩු සාදන සහ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාමට ... ... | 25 0 |
| විදුලි කොන්ත්‍රාත් කරු බලපත්‍ර ගාස්තුව ... | 20 0 |
| හරක් මස් හෝ එළුමස් කඩ බලපත්‍ර ගාස්තුව ... | 50 0 |
| ප්‍රසිද්ධ රැඟුම් බලපත්‍ර ගාස්තුව ... ... | 600 0 |
| ගිනි ගෝනි ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාමට... | 10 0 |
| හිස් බෝතල් ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාමට ... ... | 5 0 |

1–459/4—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

අහංගම සුළු නාගර සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින්, මස් විකිණීමේ කඩයක් පවත්වා ගෙන යාම පිණිස 1975 ජනවාරි මස 01 වැනිද සිට 1975 දෙසැම්බර් මස 31 වැනිද දක්වා වූ කාලය සඳහා බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, ඒ අනුව බල පත්‍රය නිකුත් කිරීම පිළිබඳව අහංගම සුළු නගර සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධවන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර, පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක්, මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළ වන දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) අංක 7 (2) දරණ වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම් කිරීමට අදහස් කරන ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| මොහොමඩ් ලසයින් මොහොමඩ් නවුෆර්, 39, පල්ලිය පාර, කටුගොඩ, ගාල්ල ... | අහංගම-පියදිගම පොදු වෙළඳ පොලෙහි මස් කඩ කාමරය | ගව සහ එළු මස් |

මහින්රි ඒ. ඩබ්ලිව්. ගුණවර්ධන,
සභාපති,
අහංගම සුළු නගර සභාව.

1975 ජනවාරි මස 02 දා,
අහංගම සුළු නගර සභා කාර්යාලයේ දීය.

1–474—7 .01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

නාත්තන්ඩිය සුළු නගර සභාව

**ගෝඝාතක ආඥාපනත**

මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි නම් සඳහන් අය, 1975 වර්ෂයට මස් වෙළඳාම සඳහා පමණක් බලපත්‍ර ඉල්ලා අයදුම්පත් මා වෙත එවා ඇති බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන නාත්තන්ඩිය සුළු නගර සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධවන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි පරිච්ඡේදයේ) අංක 7 දරණ වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

ඩබ්ලිව්. ටී. ප්‍රනාන්දු,
පාලන නිළධාරි,
නාත්තන්ඩිය සුළු නගර සභාව.

1975 ජනවාරි මස 06 වැනි දින,
සුළු නගර සභා කායර්ාලය,
නාත්තන්ඩිය.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. එන්. ජෙවාහිඩ්, අංක 7, කුරුස්වත්ත කොළණිය, නාත්තන්ඩිය ... | පොදු වෙළඳපොලේ අංක 1 හරක් මස් කඩය ... | එළ හරක් මස් |
| 2. ජේ. එම්. තව්ෆිර්, මයිලාව පාර, කම්බිකොටුව, නාත්තන්ඩිය ... | පොදු වෙළඳ පොලේ අංක 2 හරක් මස් කඩය ... | එළ හරක් මස් |
| 3. එන්. ජෙවාහිඩ්, අංක 7, කුරුස්වත්ත කොළණිය, නාත්තන්ඩිය ... | පොදු වෙළඳ පොලේ එළු මස් කඩය ... | එළු මස් |

1–552—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

## ගලහිටියාව ගමසභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛණයෙහි දක්වෙන විසින් 1975 වර්ෂයට මස් කඩයක් ගෙන යාමට බලපත්‍ර ඉල්ලුම් කර සිටින බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන ගලහිටියාව ගමසභා සීමාව තුළ ය කනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධවීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ කිරීමේ දින සිට දින ඇතුළත දී මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වැනි පරිච්ඡේදයේ 7 වෙනි වගන්තිය යට මෙයින් දනුම් දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | පිහිටි ස්ථානය |
|---|---|---|
| පී. ඩී. රිච්ඩ, "නිමල් සෙවන," බොල්ලත ... | එළු හරක් මස් ... | මාකේවිට මංසන්ධියේ දවටගහවත්ත |

එච්. ඩී. ගිල්බට්,
සභාපති,
ගලහිටියාව ගමසභාව.

1974 දෙසැම්බර් මස 31 වැනි දින,
ගලහිටියාව ගමසභාව,
ගනේමුල්ල.

1-481—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

## හම්බන්තොට නගර සභා කාර්යාලය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වන අධිකාරය)

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වන අධිකාරය) 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නීසි බලධාරියා වූ ද හම්බන්තොට නගර සභාවේ පාලන නිලධාරි තැනවූද එච්. ජී. ආනන්ද වන මම 1975 වර්ෂයේ දී පහත දක්වෙන උපලේඛනයේ සඳහන් දිනවලදී හම්බන්තොට නගර සභාවේ නගර සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සහ මස් වෙළඳාම් කිරීම සම්පූර්ණයෙන්ම මෙයින් තහනම් කරමි.

උපලේඛනය

1. 1975 ජනවාරි 14 වැනි දින තයිපොංගල් දිනය.
2. 1975 ජනවාරි 27 වැනි දින පසළොස්වක පෝය දිනය.
3. 1975 පෙබරවාරි 25 වැනි දින පසළොස්වක පෝය දිනය.
4. 1975 මාර්තු 11 වන දිනය මහසිව රාත්‍රී දිනය.
5. 1975 මාර්තු 26 වැනි දිනය පසළොස්වක පෝය දිනය.
6. 1975 මාර්තු 28 වැනි දිනය මහ සිකුරාද දිනය.
7. 1975 අප්‍රේල් 25 වැනි දිනය පසළොස්වක පෝය දිනය.
8. 1975 මැයි 22 වැනි දිනය ජනරජ දිනය.
9. 1975 මැයි 24 වැනි දිනය වෙසක් පුර පසළොස්වක් පෝය දිනය.
10. 1975 මැයි 25 වැනි දිනය වෙසක් අතිරේකය.
11. 1975 ජූනි 23 වැනි දිනය පොසොන් පුර පසළොස්වක් පෝය දිනය.
12. 1975 ජූලි 22 වැනි දිනය ඇසළ පුර පසළොස්වක් පෝය දිනය.
13. 1975 අගෝස්තු 21 වැනි දිනය පසළොස්වක පෝය දිනය.
14. 1975 සැප්තැම්බර් 19 වැනි දිනය පසළොස්වක පෝය දිනය.
15. 1975 සැප්තැම්බර් 26 වැනි දිනය බණ්ඩාරනායක සමරු දිනය.
16. 1975 ඔක්තෝම්බර් 4 වැනි දිනය සමස්ත ලෝක සත්ව දිනය.
17. 1975 ඔක්තෝම්බර් 19 වැනි දිනය පසළොස්වක පෝය දිනය.
18. 1975 නොවැම්බර් 18 වැනි දිනය පසළොස්වක පෝය දිනය.
19. 1975 දෙසැම්බර් 18 වැනි දිනය පසළොස්වක පෝය දිනය.

එච්. ජී. ආනන්ද,
පාලන නිලධාරි,
හම්බන්තොට නගර සභාව.

1975.01.01 වැනි දින, හම්බන්තොට
නගර සභා කාර්යාලයේ දීය.

1-475—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

## පල්ලෙවෙල ගමසභාව-කොළඹ දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 අධිකාරය)

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වන අධිකාරය) 17(1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නියමිත අධිකාරි තැන වූද, කොළඹ දිස්ත්‍රික්කයේ පල්ලේවෙල ගමසභාවේ පරිපාලන නිලධාරි වූ ද ඩී. එම්. එස්. දිසානායක වන මම, 1975 වර්ෂයේ දී මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් වන දිනයන් හි පල්ලෙවෙල ගමසභා ප්‍රදේශ සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සහ මස් විකිණීම සම්පූර්ණයෙන් තහනම් කරමි.

ඩී. එම්. එස්. දිසානායක,
පරිපාලන නිලධාරි—පල්ලෙවෙල ගමසභාව.

වර්ෂ 1975 ක්වූ ජනවාරි මස 03 වැනි දින,
බාදුරාගොඩ, පල්ලෙවෙල ගමසභා කාර්යාලයේ දීය.

උපලේඛනය

1975 ජනවාරි 27—දුරුතු පසළොස්වක පෝය.
1975 පෙබරවාරි 25—නවම් පසළොස්වක පෝය.
1975 මාර්තු 26—මැදින් පසළොස්වක පෝය.
1975 අප්‍රේල් 25—බක් පසළොස්වක පෝය.
1975 මැයි 24—වෙසක් පසළොස්වක පෝය.
1975 ජූනි 23—පොසොන් පසළොස්වක පෝය.
1975 ජූලි 22—ඇසළ පසළොස්වක පෝය.
1975 අගෝස්තු 21—නිකිනි පසළොස්වක පෝය.
1975 සැප්තැම්බර් 19—බිනර පසළොස්වක පෝය.
1975 සැප්තැම්බර් 26—බණ්ඩාරනායක සැමරුම් දිනය.
1975 ඔක්තෝබර් 04—ලෝක සත්ව දිනය.
1975 ඔක්තෝබර් 19—වප් පසළොස්වක පෝය.
1975 නොවැම්බර් 18—ඉල් පසළොස්වක පෝය.
1975 දෙසැම්බර් 18—උඳුවප් පසළොස්වක පෝය.

1-485—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

## ගලෙන්බිඳුනුවැව ගමසභාව

### ගෝඝාතක ආඥාපනත 272 වෙනි අධිකාරය

මෙහි පහත උපලේඛනයේ දක්වෙන අය විසින් එළු හරක් මස් වෙළඳම පිණිස 1975 වර්ෂයට බල පත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත් මෙම බල පත්‍රය නිකුත් කිරීම ගැන අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගලෙන්බිඳුනුවැව ගමසභාව සීමාව තුල පදිංචි යම් කෙනෙක් විරුධද වන්නේනම් එසේ විරුධද වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14 ඇතුලත මා වෙත ලියා එවිය යුතු බවත් ගෝඝාතක ආඥාපනතේ 272 වැනි අධිකාරයේ 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ලිපිනය | වෙළඳාම පිණිස මස්කඩය පිහිටි ස්ථානය |
|---|---|---|
| 1. ඒ. නාගුර්කන්නී ... | ගෝමරයන්, කල්ල, ගලෙන්බිඳුනුවැව ... | ගලෙන්බිඳුනුවැව නගරයේ ව. අ. 35 ස්ථානයේ |

ඩබ්ලිව්. මුදලිහාමි,
ගලෙන්බිඳුනුවැව ගමසභාවේ සභාපති තැන.

1975.01.06
ගලෙන්බිඳුනුවැව ගම සභාව,
ගලෙන්බිඳුනුවැව.

1-621—75.10.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

### මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව පල්ලේ ගම්පහ දකුණු ගම සභාව

#### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත උපලේඛණයෙහි නම් සඳහන් අය විසින් එහි දක්වෙන ස්ථානයන්හි 1975 වර්ෂයට මස්කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍රයක් ඉල්ලුම්කර ඇති බැවින් ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන හාරිස්පත්තුව පල්ලේගම්පහ දකුණ ගම් ප්‍රදේශයේ තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේනම් එසේ විරුද්ධ වීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුක්ත ලියවිල්ලක් මෙම දන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවිය යුතු බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 වෙනි අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳම | ස්ථානය |
|---|---|---|
| එන්. එස්. එච්. මොහම්මඩ් ... | එළහරක්මස් විකිණීම | පොල්වත්ත බුලුකොහොතැන්න, අකුරණ |

1975 ක්වූ ජනවාරි මස 03 වැනි දින,
හා. ප. පල්ලේගම්පහ දකුණ ගම්සභා කාර්යාලය,
වැකඩුහදිරම, බටුගොඩ.

පී. ඇන්. ඇම්. රෂීඩ්,
සභාපති,
හා. ප. පල්ලේගම්පහ දකුණ ගම්සභාව.

1–637—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### පුත්තලම දිස්ත්‍රික්කයේ—මැදපළාත ගම්සභාව

#### ගෝඝාතක ආඥපනත

මෙහි පහත උපලේඛනයෙහි නම සඳහන් අය විසින් ඔහුගේ නම ඉදිරියේ දක්වෙන ස්ථානයේ 1975 වර්ෂයට මස් පිණිස සතුන් මැරීමට සහ මස් කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍රයක් ඉල්ලා මා වෙත අයදුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇත. ඒ බැව් 272 වැනි අධිකාරය වන ගෝ ඝාතන ආ ඥ පනතේ 7(2) වැනි වගන්තිය අනුව මෙයින් දන්වමි. මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන මැද පළාත ගම්සභා ප්‍රාදේශ සීමාව තුළ යම් අයෙක් විරුද්ධ වන්නේ නම් කුමන හේතුන් නිසාදයි යන වග සඳහන් කර ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින දහතරක් (14) ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දනුම් දෙමි.

#### උප ලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ජුනයිදීන් මොහමඩ් පාරුක් ... | හරක් මස් ... | මාවිල ඒ. ඇම්. එල්බට් කොස්තාට අයත් කුම්මෝදර නිදිකුම්බවත්ත කියන ඉඩම |

1975.01.03 වැනි දින,
මැද පළාත ගම්සභා කාර්යාලයේදීය,
තබ්බෝව—නාත්තන්ඩිය.

ඒරන් අභයකෝන්,
සභාපති,
මැදපළාත ගම්සභාව,

1–636—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### දිවුලපිටිය ගම්සභාව

#### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් අය එහි සඳහන් ස්ථානයෙහි 1975 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා අවසර පත්‍ර ඉල්ලා මාවෙත අයදුම් පතක් එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපණතේ 272 වෙනි පරිච්ඡේදයේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම් බලපත්‍රය නිකුත් කිරීම ගැන කොළඹ දිස්ත්‍රික්කයේ දිවුලපිටිය ගම්ප්‍රදේශයේ ගම්සභා බල සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුද්ධවන්නේ කුමන කරුණු නිසාද යන වග සඳහන් වන ලියවිල්ලක් පිටපත් දෙකකින් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට 14 දිනක් ඇතුළත මාවෙත එවිය යුතු බව මෙයින් දන්වමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | මස්කඩය පිහිටි ස්ථානය |
|---|---|
| ඇම්. අයි. ඇම්. නජීබ් ඩීන්, ගල් ඔලුව, මිණුවන් ගොඩ. | දිවුලපිටිය පොදු වෙළඳ පොල |

කේ. ඇම්. කරුණාසේන,
දිවුලපිටිය ගම්සභාවේ සභාපති.

දිවුලපිටිය ගම්සභා කාර්යාලය,
දූනාගහ,
1975 ජනවාරි 02.

1–626—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

---

### මීරිගම සුළු නගර සභාව

#### ගෝඝාතක ආඥපනත (272 අධිකාරය)

ගෝඝාතක ආඥපනතේ (272 අධිකාරිය) 17 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලය ප්‍රකාර, නිසි බලධාරියාවූද, මීරිගම සුළු නගර සභාවේ පරිපාලන නිලධාරි තැනවූද, ඩබ්ලිව්. ඩබ්ලිව්. ඇල්. ඇම්. අබේසේකර වන මම 1975 වර්ෂය තුළදී පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන දිනවල මීරිගම සුළු නගර සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සහ මස් විකිණීම පිණිස ප්‍රදර්ශනය සම්පූර්ණයෙන් මෙයින් තහනම් කරමි.

ඩබ්ලිව්. ඩබ්ලිව්. ඇල්. ඇම්. අබේසේකර,
පරිපාලන නිලධාරි,
මීරිගම සුළු නගර සභාව.

1975 ජන්වාරි මස 01 වැනි දින,
මීරිගම සුළු නගර සභා කාර්යාලයේ දී ය.

#### උපලේඛනය

1975 ජනවාරි 27
1975 පෙබරවාරි 25
1975 මාර්තු 26
1975 අප්‍රේල් 25
1975 මැයි 24 සහ 25
1975 ජූනි 23
1975 ජූලි 22
1975 අගෝස්තු 21
1975 සැප්තැම්බර් 19
1975 ඔක්තෝබර් 04
1975 ඔක්තෝබර් 19
1975 නොවැම්බර් 18
1975 දෙසැම්බර් 18.

1–571—75.01.17 දින අංක 147 දරණ ගැසට් පත්‍රය

## අවිස්සාවේල්ල නගර සභාව—නගර සභා ආඥාපනත

### 1975 වර්ෂය සඳහා දේපොල බද්ද

(255 වැනි අධිකාරිය වන) නගර සභා ආඥාපනතේ 160 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන, අධිකරණ සහ ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් දෙන ලද අනුමතිය ඇතිව අවිස්සාවේල්ල නගරය තුළ පිහිටි සියළුම නිශ්චල දේපොලවල වාර්ෂික වටිනාකමින් පහත සඳහන් ප්‍රමාණවල බද්දක් සභාව විසින් නියමකරනු ලැබිය හැකි සීමාකිරීම්, සුදුසුකම් හා කොන්දේසිවලට යටත්ව පිළිවලින් 1975 මාර්තු 31 ජූනි 30 සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි සමාන කොටස් හතරකින් ගෙවියයුතුවන පරිදි 1975 වර්ෂය සඳහා ඉහත කී වගන්තිය යටතේ පනවන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :—

(අ) කොට්ඨාශ අංක 1—කුඩගම

කොට්ඨාශ අංක 2—මානික්කවත්ත

කොට්ඨාශ අංක 3—කඩවීදිය—වෙරළුපිටිය පාර වරිපනම් අංක 1 සිට 27
වෙරළුපිටිය පාර වරිපනම් අංක 87 සිට 153
වෙරළුපිටිය පාර වරිපනම් අංක 10 සිට 50
හල්තොටවත්ත පටුමග වරිපනම් අංක 5 සිට 15
විද්‍යාල පාර වරිපනම් අංක 79 සිට 87

කොට්ඨාශ අංක 4—වෙරළුපිටිය—හල්තොටවත්ත පටුමග වරිපනම් අංක 10 සිට 32
හල්තොටවත්ත අංක 19 සිට 55/1
විද්‍යාල මාවත වරිපනම් අංක 99 සිට 103/5
වෙරළුපිටිය පාර වරිපනම් අංක 90/1 සිට 100/38

කොට්ඨාශ අංක 8—උක්වත්ත—ඇන්විල් පාර වරිපනම් අංක 1 සිට 49
ඇන්විල් පාර වරිපනම් අංක 2 සිට 54
හොනින්ටන් පෙදෙස වරිපනම් අංක 45/10 සිට 45/12
කොළඹ පාර වරිපනම් අංක 149 සිට 247
කොළඹ පාර වරිපනම් අංක 96 සිට 220
කුඩගම පාර වරිපනම් අංක 1 සිට 11/16

කොට්ඨාශ අංක 9—කිරිවන්දෙල

කොට්ඨාශ අංක 10—මීපිලාව

කොට්ඨාශ අංක 11—පුවක්පිටිය

කොට්ඨාශ අංක 12—එගොඩගම

යන කොට්ඨාශවල පිහිටි සියළුම නිශ්චල දේපොලවල වාර්ෂික වටිනාකමින් සියයට අටක දේපොල පිළිබඳ වරිපනම් බද්දක් සහ

(ආ) කොට්ඨාශ අංක 3—කඩවීදිය—කොළඹ පාර වරිපනම් අංක 1 සිට 49
කොළඹ පාර වරිපනම් අංක 2 සිට 92
කොටබොඩවත්ත පාර වරිපනම් අංක 7 සිට 65බී
කොටබොඩවත්ත පාර වරිපනම් අංක 10 සිට 40
විද්‍යාල පාර පරිපනම් අංක 11 සිට 75 සහ 6
කුඩගම පාර වරිපනම් අංක 1 සිට 24/6
රත්නපුර පාර වරිපනම් අංක 1 සිට 31
රත්නපුර පාර වරිපනම් අංක 2 සිට 52
යටියන්තොට පාර වරිපනම් අංක 1 සිට 31/8
යටියන්තොට පාර වරිපනම් අංක 2 සිට 32
ධර්මපාල මාවත වරිපනම් අංක 1 සිට 5

කොට්ඨාශ අංක 4—වෙරළුපිටිය—පළමුවෙනි පටුමග වරිපනම් අංක 10 සිට 40
පළමුවැනි පටුමග අංක 1 සිට 43
විද්‍යාල මාවත වරිපනම් අංක 12 සිට 70
පන්සල පාර වරිපනම් අංක 4 සිට 30/4
පන්සල පාර වරිපනම් අංක 3 සිට 19/1
යටියන්තොට පාර වරිපනම් අංක 33 සිට 133

කොට්ඨාශ අංක 5—සීතාවක

කොට්ඨාශ අංක 6—ගලපිටමඩ

කොට්ඨාශ අංක 7—නාගස්ලන්ද

කොට්ඨාශ අංක 8—උක්වත්ත—කොළඹ පාර වරිපනම් අංක 53 සිට 143/1
දුම්රියපොල පාර වරිපනම් අංක 1 සිට 9/35
දුම්රිය පොල පාර වරිපනම් අංක 2 සිට 4/1

යන කොට්ඨාශවල පිහිටි සියළුම නිස්චල දේපොලවල වාර්ෂික වටිනාකමින් සියයට දෙළහක දේපොල පිළිබඳ වරිපනම් බද්දක් වේ.

වර්ෂ 1975 ක්වූ ජනවාරි මස 2 වෙනි දින,
අවිස්සාවේල්ල නගර සභා කාර්යාලයේදීය.

ආර්. ඇල්. ඒ. ඇස්. ඇලෝසියස්,
සභාපති, අවිස්සාවේල්ල නගර සභාව.

1-545—75.01.17 දින අංක 147 දරන ගැසට් පත්‍රය

### මාතලේ මැදසියපත්තු ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උප ලේඛණයේ සඳහන් අය විසින් එළහරක් මස් කඩ පවත්වාගෙන යාම සඳහා 1975 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බැවින්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන මාතලේ මැදසිය පත්තු ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධවීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුලත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරයේ) අංක 7 දරණ වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. පාතිමාබීබී ... | ... එළහරක් මස් | ... නිකලන්දවත්ත, රයිතලාවෙල |
| 2. ඇම්. එච්. ඇම්. ඉක්බාල් | ... එළහරක් මස් | ... නිකලන්දවත්ත, රයිතලාවෙල |
| 3. ඇන්. ඒ. ලතීප් ... | ... එළහරක් මස් | ... උකුවෙලවත්ත, වරකාමුර |
| 4. ඕ. ඇල්. ඇම්. රෂීඩ් | ... එළහරක් මස් | ... මැදසියමුදියාන්සේලාගේවත්ත, වරකාමුර |
| 5. ඇම්. ඒ. මීරාසයිබු | ... එළහරක් මස් | ... උකුවෙල ප්‍රසිද්ධ වෙළඳපොල අංක 1 කඩකාමරය |
| 6. ඇස්. ඇම්. ඉස්මයිල් | ... එළහරක් මස් | ... උකුවෙල ප්‍රසිද්ධ වෙළඳපොල අංක 2 කඩකාමරය |

ඒ. බී. විජේසිංහ,
සභාපති,
මාතලේ මැදසියපත්තු ගම්සභාව.

ගම්සභා කායර්‍යාලය,
උකුවෙල, 1975.1.1.

1–536—75.01.17 දින අංක 147 දරන ගැසට් පත්‍රය

---

### කොට්කාවත්ත සුළු නගර සභාව

### ගෝඝාතක ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය එම උපලේඛනයේ ඔහුගේ නමට ඉදිරියෙන් සඳහන් ස්ථානයන්හි 1975 වර්ෂය තුලදී මස් පිණිස සතුන් මරා වෙළඳාම් කරගෙන යාමට බලපත්‍රයක් මගෙන් ඉල්ලා ඇති බව 1947 අංක 44 දරණ ආඥාපනතේ 6 වන වගන්තියෙන් සංශෝධිත ගෝඝාතක ආඥාපනතේ (272) අධිකාරය 7 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධ වීමට අදහස් කරන කොට්කාවත්ත සුළු නගර සභා පාලන සීමාව තුල පදිංචි ඕනෑම කෙනෙකු විසින් බල පත්‍රය නිකුත් කිරීමට තමන්ගේ විරුද්ධත්වයට කරුණු දක්වන පිටපත් දෙකකින් යුත් ලිඛිත ප්‍රකාශයක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත සැපයිය යුතුය.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳම | ස්ථානය |
|---|---|---|
| 1. ඒ. එච්. ඩේවිඩ් අපප්පුහාමි, අංක 21, කුඩාබුත්ගමුව, අංගොඩ ... | ... හරක් මස් | ... අයි.ඩී.එච්. හංදිය |
| 2. ඒ. එච්. ඩේවිඩ් අප්පුහාමි, අංක 21, කුඩාබුත්ගමුව, අංගොඩ ... | ... හරක් මස් | ... කොට්කාවත්ත ප්‍රසිද්ධ වෙළඳ පොල |

ඇම්. ඇල්. පෙරේරා,
සභාපති,
කොට්කාවත්ත සුළු නගර සභාව.

සුළු නගර සභා කායර්‍යාලය,
කොට්කාවත්ත, අංගොඩ,
1975 ජනවාරි 07 වෙනි දින,

1–544—75.01.17 දින අංක 147 දරන ගැසට් පත්‍රය

---

### දන්කොටුව සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛණයේ නම් සඳහන් අය විසින් එහි දක්වෙන ස්ථානයේ 1975 වර්ෂය තුල මස් කඩයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර අයදුම් කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන දන්කොටුව නගරය තුළ ස්ථිර පදිංචි ඕනෑම අයෙකු හෝ සංවිධානයක විරුද්ධතාවයක් ඇත්නම් එය විස්තර සහිත ලිපියකින් පිටපත් දෙකක් සිටිනු සේ සකස් කොට මෙම දැන්වීම ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවීමට අවසර ඇති බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරය) 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | බලපත්‍රයේ ස්වභාවය | ස්ථානය |
|---|---|---|
| 1. ඩබ්ලිව්. ඩී. කැෂ්මියර්, පිටාගාර–දන්කොටුව ... ... | ... හරක් මස් වෙළෙඳාම | ... දන්කොටුව පොදු වෙළඳ සැල |
| 2. ඩබ්ලිව්. මිගෙල් ප්‍රනාන්දු, උතුරු ගෝනාවිල, දන්කොටුව ... | ... හරක්, එළු හා ඌරු මස් වෙළෙඳාම | ගෝනාවිල පල්ලිය අසල |

ඩබ්. ඇම්. ජේ. ඇන්තනි ප්‍රනාන්දු,
පාලන නිලධාරි,
දන්කොටුව නගරය.

1975 ජනවාරි මස 03 වැනි දින,
දන්කොටුව නගරයේ පාලන නිලධාරි කාර්යාලය,
දන්කොටුව.

1–620—75.01.17 දින අංක 147 දරන ගැසට් පත්‍රය

### ගල්ගමුව ගම්සභා කාර්යාලය

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය විසින් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වෙන ස්ථානවල 1975 වර්ෂයට මස් පිණිස සතුන් මැරීමට හා මස් කඩ පවත්වාගෙන යාමට බලපත්‍රයක් ඉල්ලා ඉල්ලුම් පත්‍රයක් මා වෙත ඉදිරිපත් කර ඇති බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 පරිච්ඡේදයේ 1974 අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වන වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන ගල්ගමුව ගම්සභා ප්‍රදේශ සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතුන් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දී සිටිමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම් කරන ස්ථානය |
|---|---|
| 1. ඒ. මර්තුක්කු පොදු වෙළඳ හල ගල්ගමුව ... | පොදු වෙළඳ හල අංක 1 කඩ කාමරය—ගවමස්. |
| 2. ඒ. මර්තුක්කු පොදු වෙළඳ හල ගල්ගමුව ... | පොදු වෙළඳ හල අංක 2 කඩ කාමරය—එළුමස් |

ගම්සභාපති,
ගල්ගමුව ගම්සභාව.

ගම්සභා කාර්යාලය,
ගල්ගමුව, 74. 12. 31.

1-619—75.01.17 දින අංක 147 දරන ගැසට් පත්‍රය

---

### උඩපළාත කඳුකර ඉහළ ගම්සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි පහත උප ලේඛනයේ නම් සඳහන් අය එහි සඳහන් ස්ථානයෙහි 1975 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා අවසර ඉල්ලා අයදුම් පත් මාවෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ 272 වෙනි පරිච්ඡේදයේ 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

එම බලපත්‍ර නිකුත් කිරීම ගැන මහනුවර දිස්ත්‍රික්කයේ උඩපළාත කඳුකර ඉහළ ගම්ප්‍රදේශයේ ගම්සභා සීමාව තුළ යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන කරුනු නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට 14 දිනක් ඇතුලත මාවේත එවිය යුතු බව මෙයින් දන්වමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ න්ම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. ඩී. ඇම්. තුවාන්, පුපුරැස්ස ... ... ... | හරක් මස් විකිණීම ... | පුපුරැස්ස |
| 2. ඩී. ඇම්. තුවාන්, පුපුරැස්ස ... ... ... | එළුමස් විකිණීම ... | පුපුරැස්ස |

ඩබලිව්. ඇස්. රාජපක්ෂ,
සභාපති,
උඩපළාත් කඳුකර ඉහළ ගම්සභාව.

1975 ජනවාරි 8 වැනි දින
අටබාගේ.

1-593—75.01.17 දින අංක 147 දරන ගැසට් පත්‍රය

---

### කොළොන්නාව පළාත් ආණ්ඩු සභාව

වර්ෂ 1975 සඳහා රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද
1939 වර්ෂයේ අංක 61 දරණ පළාත් ආණ්ඩු සභා ආඥාපනත

වර්ෂ 1939 අංක 61 දරණ පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ 173 වෙනි ඡේදය අනුව කොළොන්නාව පළාත් ආණ්ඩු සභාව මගින් පසුගිය වර්ෂවල මෙන් රථවාහන හා සතුන් පිළිබඳ 1975 වර්ෂය සඳහා පහත සඳහන් බදු පනවා ඇති බවද, එම බදු මුදල් පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ 176 තුන්වෙනි ඡේදය අනුව 1975 මාර්තු මස 31 වෙනි දිනට ප්‍රථම කොළොන්නාව පළාත් ආණ්ඩු සභාවට ගෙවිය යුතු බවද මෙයින් දන්වමි.

#### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් රථය, රෝද තුනේ මෝටර් රථය, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, කරත්ත, අත් කරත්ත ජින් රික්ෂෝ, බයිසිකල් හෝ රෝද තුනේ බයිසිකල් හැර ඕනෑම අන්දමේ වාහනයකට ... | 5 | 0 |
| ඕනෑම බයිසිකලයකට හෝ රෝද තුනේ බයිසිකලයකට හෝ බයිසිකල් රථයකට ... ... | 3 | 0 |
| වෙළඳාම පිණිස පාවිච්චි කරනු ලබන්නේ නැති ඒවාට ... | 1 | 0 |
| ගොන් දෙන්නා බැඳි සෑම කරත්තයකට හෝ තිරික්කලයකට ... ... | 3 | 0 |
| තනි ගොනා බැඳි සෑම කරත්තයකට හෝ තිරික්කලයකට | 2 | 0 |
| සෑම අත් කරත්තයකට ... ... | 2 | 0 |
| සෑම ජින් රික්ෂෝවකට ... ... | 2 | 0 |
| සෑම අශ්වයෙකුට හෝ පෝනියෙකුට හෝ කොටළුවෙකුට | 2 | 0 |
| සෑම ගොනෙකුට හෝ බූරුවෙකුට ... ... | 1 | 0 |

සෝමසිරි ගලගෙදර,
සභාපති,
කොළොන්නාව පළාත් ආණ්ඩු සභාව.

1975 ජනවාරි මස 06 වෙනි දින,
කොළොන්නාව පළාත් ආණ්ඩු සභා කාර්යාලය,
වැල්ලම්පිටිය.

1-584/1—75.01.17 දින අංක 147 දරන ගැසට් පත්‍රය

---

### කොළොන්නාව පළාත් ආණ්ඩු සභාව

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත—334 පරිච්ඡේදය
1975 වර්ෂයේ සුනඛ බදු

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 334 වෙනි පරිච්ඡේදයේ 4 වෙනි ඡේදය අනුව කොළොන්නාව පළාත් ආණ්ඩු සභා සීමාව තුළ සිටින සෑම බැල්ලියකටම ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් රු. 2.50 ක්ද, සෑම බල්ලෙකුටම ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් රු. 1,50 ක්ද, ගෙවීමට පනවා ඇති බවද, එම ලියාපදිංචි කිරීමේ ගාස්තුව 1975 මාර්තු මස 31 වෙනි දිනට ප්‍රථම කොළොන්නාව පළාත් ආණ්ඩු සභා කාර්යාලයට ගෙවිය යුතු බවද මෙයින් දනුම් දෙමි.

සෝමසිරි ගලගෙදර,
සභාපති,
කොළොන්නාව පළාත් ආණ්ඩු සභාව.

1975 ජනවාරි මස 06 වෙනි දින,
කොළොන්නාව පළාත් ආණ්ඩු සභා කාර්යාලය,
වැල්ලම්පිටිය.

1-584/2—75.01.17 දින අංක 147 දරන ගැසට් පත්‍රය

### බටහිර කඩවත් කෝරළේ ගම්සභාව—අනුරාධපුර දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයේ නම් සඳහන් අය විසින් සතුන් මරා මස් විකිණීම සඳහා 1975 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන විරුද්ධව බටහිර කඩවත් කෝරළේ ගම්සභාව සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒගැන විරුද්ධ වන්නේ අසවල් කරුණු සඳහා යයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට දින 14 ක් ඇතුලතදී මාවෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (272 වැනි අධිකාරය) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

වී. ඇම්. සිරිවර්ධන,
බටහිර කඩවත් කෝරළේ ගම්සභාවේ සභාපති.

1975.01.06 වෙනි දින,
බටහිර කඩවත් කෝරළේ ගම්සභා කාර්යාලයේ දිය.
මෛත්‍රීපුර, මැදවච්චිය.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| කේ. සේගු මොහමඩ්, නුවර පාර, මැදවච්චිය ... ... | හරක් මස් හා එළු මස් ... | අංක 29, හොරොව්පොතාන පාර, මැදවච්චිය |

1-585—75.01.17 දින අංක 147 දරන ගැසට් පත්‍රය

---

### කනදරා කෝරළේ ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1975 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍රයක් නිකුත් කිරීම ගැන කනදරා කෝරළේ ගම්සභා බල ප්‍රදේශය තුළ යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද් ධවීමට හේතු සඳහන් පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවද, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ 272 පරිච්ඡෙදයේ අංක 7 (2) දරණ වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| එම්. එම්. ශී. නාවූර් පිච්චෙ, ජබීර් ස්ටෝර්ස්, කහටගස්දිගිලිය ... ... | එළහරක් මස් ... | සිප්පිකුලම |

යූ. ඇල්. අප්පුහාමි,
කනදරා කෝරළේ ගම් සභාපති.

1974.12.30 වෙනි දින,
මිහින්තලේ,
කනදරා කෝරළේ ගම්සභා කාර්යාලයේදී ය.

1-638—75.01.17 දින අංක147 දරන ගැසට් පත්‍රය

---

### හාරිස් පත්තුව මැදසියපත් තුව ගම්සභාව

### මස් පිණිස සතුන් මරන් නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛණයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1975 වර්ෂයට බල පත්‍රයක් ඉල් ලුම් කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන හාරිස්පත්තුව මැදසිය පත් තුව ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුතු ලියවිල් ලක් මෙම දැන් වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන් නන් පිළිබඳ ආඥාපනතේ (272 පරිච්ඡේදය) අංක 7 දරණ වගන් තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල් ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම් කිරීමට අදහස් කරන ස් ථානය |
|---|---|
| 1. ඒ. ඇම්. ඇම්. මුනීර්, ගල ගෙදර, මඩිගේ ... | අරබේකඩේ අංක 1 දරණ ගෙය. |
| 2. එම්. එස්. එම්. නිසාර්, පල් කුඹුර, වැරැල්ලගම ... | පල්කුඹුර, දූල්වැල්ගොඩ නමැති ඉඩම. |
| 3. ඒ. එම්. ජුනයිදීන්, විගුහුම් පොල, වැරැල්ලගම ... | විගුහුම්පොල, මොරගිටියාවි තමැති ඉඩම. |

එම්. පී. එස්. මරවනාගොඩ,
හාරිස්පත්තුව මැදසියපත්තුව ගම්සභාපති.

1. 1. 75 වැනි දින,
කුඹුරේගම,
අරබේකඩේ ගම්සභා කාර්යාලයේ දීය.

1-643—75.01.17 දින අංක 147 දරන ගැසට් පත්‍රය

---

### මීරිගම සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ නම් සඳහන් අය විසින් එහි විස්තර සඳහන් පරිදි 1975 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍රයක් ඉල්ලා අයදුම් පත්‍රයක් මා වෙත ඉදිරිපත් කර ඇති බැවින් එය මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ 272 වැනි පරිච්ඡෙදයේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන මීරිගම සුළු නගර සභා ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේනම් එය කුමන කරුණක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට 14 දිනක් ඇතුළතදී මා වෙත එවියයුතු බව දන්වා සිටිමි.

#### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම් කරන ස්ථානය | වෙළඳාම |
|---|---|---|---|
| 1. | ඩී. ඒ. ඇන්. අප්පුහාමි ... ... ... | පොදු වෙළඳසැලේ අංක 1 හරක් මස් කඩ කමාරය ... | හරක් මස් |
| 2. | ඩී. ඒ. ඇන්. අප්පුහාමි ... ... ... | පොදු වෙළඳසැලේ අංක 2 හරක් මස් කඩ කමාරය ... | හරක් මස් |
| 3. | ඩී. ඒ. ඇන්. අප්පුහාමි ... ... ... | පොදු වෙළඳසැලේ අංක 3 එළුමස් කඩ කාමරය ... ... | එළු මස් |
| 4. | ඩී. ඒ. ඇන්. අප්පුහාමි ... ... ... | පොදු වෙළඳසැලේ අංක 4 හරක් මස් කඩය (පැරණි ඌරුමස් කඩය) ... | හරක් මස් |

ඩබ්ලිව්. ඩබ්ලිව්. ඇල්. ඇම්. අබේසේකර,
පරිපාලන නිලධාරි,
මීරිගම සුළු නගර සභාව.

1975 ජනවාරි මස 01 වැනි දින,
මීරිගම සුළු නගර සභා කාර්යාලයේ දිය.

1-570—75.01.17 දින අංක 147 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රය පළ කිරීම සඳහා නිවේදන භාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන් අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛණයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්‍යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1975

| මාසය | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| ජනවාරි | 03.01.75 | සිකුරාද | 27.12.74 | සිකුරාද | දවල් 12.00 |
| | 10.01.75 | සිකුරාද | 03.01.75 | සිකුරාද | දවල් 12.00 |
| | 17.01.75 | සිකුරාද | 10.01.75 | සිකුරාද | දවල් 12.00 |
| | 24.01.75 | සිකුරාද | 17.01.75 | සිකුරාද | දවල් 12.00 |
| | 31.01.75 | සිකුරාද | 24.01.75 | සිකුරාද | දවල් 12.00 |
| පෙබරවාරි | 07.02.75 | සිකුරාද | 31.01.75 | සිකුරාද | දවල් 12.00 |
| | 14.02.75 | සිකුරාද | 07.02.75 | සිකුරාද | දවල් 12.00 |
| | 21.02.75 | සිකුරාද | 14.02.75 | සිකුරාද | දවල් 12.00 |
| | 28.02.75 | සිකුරාද | 21.02.75 | සිකුරාද | දවල් 12.00 |
| මාර්තු | 07.03.75 | සිකුරාද | 28.02.75 | සිකුරාද | දවල් 12.00 |
| | 14.03.75 | සිකුරාද | 07.03.75 | සිකුරාද | දවල් 12.00 |
| | 21.03.75 | සිකුරාද | 14.03.75 | සිකුරාද | දවල් 12.00 |
| | 27.03.75 | බ්‍රහස්පතින්ද | 21.03.75 | සිකුරාද | දවල් 12.00 |
| අප්‍රේල් | 04.04.75 | සිකුරාද | 27.03.75 | බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 11.04.75 | සිකුරාද | 04.04.75 | සිකුරාද | දවල් 12.00 |
| | 18.04.75 | සිකුරාද | 11.04.75 | සිකුරාද | දවල් 12.00 |
| | 24.04.75 | බ්‍රහස්පතින්ද | 18.04.75 | සිකුරාද | දවල් 12.00 |
| මැයි | 02.05.75 | සිකුරාද | 24.04.75 | බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 09.05.75 | සිකුරාද | 02.05.75 | සිකුරාද | දවල් 12.00 |
| | 16.05.75 | සිකුරාද | 09.05.75 | සිකුරාද | දවල් 12.00 |
| | 23.05.75 | සිකුරාද | 16.05.75 | සිකුරාද | දවල් 12.00 |
| | 30.05.75 | සිකුරාද | 23.05.75 | සිකුරාද | දවල් 12.00 |
| ජූනි | 06.06.75 | සිකුරාද | 30.05.75 | සිකුරාද | දවල් 12.00 |
| | 13.06.75 | සිකුරාද | 06.06.75 | සිකුරාද | දවල් 12.00 |
| | 20.06.75 | සිකුරාද | 13.06.75 | සිකුරාද | දවල් 12.00 |
| | 27.06.75 | සිකුරාද | 20.06.75 | සිකුරාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1975 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරනා ලදී